# (උ) රජයේ මුදල් පරිහරණය

**1962-63 මුදල් වර්ෂය**

1962 ඔක්තෝබර් මාසයේ සිට 1963 සැප්තැම්බර් මාසය තෙක් වූ මුදල් වර්ෂය සඳහා ලංකාණ්ඩුවේ ගිණුම් සාරාංශය පසුගිය වර්ෂවල අනුරූප සංඛ්‍යා තොරතුරුද සමග II උ—1 සංඛ්‍යා සටහනෙහි දක්වේ. මේ සටහනෙහි දක්වා ඇති පරිදි අයවැය ලේඛන ගනුදෙනුවල ප්‍රධාන ලක්ෂණ මෙසේ ය :—

(අ) 1962/63 රජයේ මුළු ආදායම රුපියල් කෝටි 159·34 ක් විය. 1961/62 මුළු ආදායම රුපියල් කෝටි 162·06 ක් වූ අතර, 1960/61 දී රුපියල් කෝටි 151·39 ක් විය.

(ආ) 1962/63 සම්මත මුළු වියදම රුපියල් කෝටි 199·87 ක් විය. 1961/62 සම්මත මුළු වියදම් රුපියල් කෝටි 206·13 ක් වූ අතර, 1960/61 දී එය රුපියල් කෝටි 196·07 ක් විය. මේ සංඛ්‍යාවලට නිදන් අරමුදල් දීමනා ආදායමෙන් කෙලින් ම ගෙවන ලද රාජ්‍ය ණය සහ පොත් ගැලපිළි ඇතුළත් නොවේ.

(ඇ) අත්තිකාරම් ගිණුම් ගනුදෙනු නිසා රුපියල් කෝටි 1.37 ක (ශුද්ධ) ලැබීමක් ඇති විය. 1961/62 මේ සම්බන්ධයෙන් රුපියල් කෝටි 1.46 ක (ශුද්ධ) ගෙවීමක් වූ අතර 1960/61 දී ඇති වූ ගෙවීම රුපියල් කෝටි 1.42 ක් විය.

(ඈ) මේ ආදායම් හා වියදම් හේතු කොට රජයට ඇති වූ (ශුද්ධ) අයවැය හිඟය රුපියල් කෝටි 39·17 ක් විය. 1961/62 දී රුපියල් කෝටි 45·61 ක හිඟයක් ඇති වූ අතර 1960/61 දී ඇති වූ හිඟය රුපියල් කෝටි 46·25 ක් විය.

මුලින් ඇස්තමේන්තු කළ අයවැය හිඟය රුපියල් කෝටි 41·33 ක් වුවද, නියම අයවැය හිඟය රුපියල් කෝටි 39·17 ක් වීමෙන්, එය මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් කෝටි 2·16 කින් අඩු විය. 1961/62 දී නියම වශයෙන් ඇති වූ අයවැය හිඟය මුල් ඇස්තමේන්තුවලට වඩා රුපියල් කෝටි 17·56 කින් වැඩි විය. ඇස්තමේන්තුවලට වඩා 1962/63 දී අයවැය හිඟය අඩු වූයේ ලැබුන ආදායම් ප්‍රමාණයද බොහෝ සෙයින් අඩු වී තිබියදීත්ය. අයවැය හිඟය මෙසේ අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ 1962/63 දී කැරුන මුළු වියදම සැලකිය යුතු පරිදි අඩුවීමය. මුල් ඇස්තමේන්තු සමග සසඳන විට මුළු වියදම රුපියල් කෝටි 13.15 කින් අඩුවිය. ප්‍රාග්ධන වියදම් රුපියල් කෝටි 7.10 කින් අඩු වූ අතර වර්තන වියදම් රුපියල් කෝටි 6.05 කින් අඩුවිය. මේ දෙවර්ගය යටතේ ඇති වූ අඩුවීම, අය වැය ලේඛන ඇස්තමේන්තුවල සියයට ගණනක් වශයෙන් දක්වන්නේ නම්, එය පිළිවෙළින් සියයට 15.0 ක් සහ සියයට 3.7 ක් වෙයි. අත්තිකාරම් ගිණුම් ගනුදෙනු නිසා ඇති වූ ශුද්ධ ලැබීම වන රුපියල් කෝටි 1.37 ද ඇස්තමේන්තු කළ අය වැය හිඟය අඩු කිරීමෙහි ලා උපකාරී විය. 1961/62 වර්ෂය හා සසඳන විට, 1962/63 දී ශුද්ධ අය වැය හිඟය රුපියල් කෝටි 6.44 කින් අඩු වී ඇති බව පෙනේ. මෙයට හේතු වූයේ, ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 7.83 කින් අඩු වීමත් අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වලින්, රුපියල් කෝටි 2.83 ක් ලැබීමත් සහ, ආදායම රුපියල් කෝටි 2.72 කින් අඩුවීමත් ආවර්තන වියදම් රුපියල් කෝටි 1.57 කින් වැඩිවීමත් යන කරුණුය.

**ආදායම**

1962/63 වර්ෂය සඳහා තාවකාලික ආදායම් ඇස්තමේන්තු සහ නියම වශයෙන් ලැබුන ආදායම් ප්‍රධාන ආදායම් ශීර්ෂ යටතේ වර්ගකොට II වැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1962/63 වර්ෂය සඳහා රජයේ මුළු ආදායම රුපියල් කෝටි 159·34 කි. මෙය 1961/62 වර්ෂය සඳහා ලැබුන රුපියල් කෝටි 162·06 ආදායමට වඩා රුපියල් කෝටි 2·72 කින් අඩුය. මේ අනුව, 1952/53 සිට අඛණ්ඩව පැවැති ආදායම වැඩිවීමේ ලක්ෂණය ඛණ්ඩ වී ඇති බව පෙනේ. 1960/61 මුදල් වර්ෂය හා සසඳන විට, 1961/62 මුදල් වර්ෂයේදී රජයේ ආදායම රුපියල් කෝටි 10·67 කින් වැඩි වී ඇත.

1961/62 වර්ෂයට වඩා ආදායම අඩුවීමට ප්‍රධානතම හේතුව වූයේ, ආනයන බදු පමණක් රුපියල් කෝටි 6·73 කින් අඩුවීමයි. මේ පහළ වැටීම කෙරෙහි බලපා ඇති ප්‍රධානතම අය ශීර්ෂයක් වී ඇත්තේ, ''අනෙකුත් භාණ්ඩ'' ගණයේ අය ශීර්ෂ යයි. මෙසේම, අපනයන බදු ද රුපියල් කෝටි 1.22 කින් අඩු විය. මෙයට, තේ බද්ද ඇතුළු තේ අපනයන බදු වලින් ලද ආදායම රුපියල් කෝටි 0·77 කින් අඩුවීමද ඇතුළත් වෙයි.

සංඛ්‍යා සටහන II උ—1

| | 1951-52 | 1952-53 | 1953-54 | 1954-55 |
|---|---|---|---|---|
| **1. ශුද්ධ අයවැය අතිරික්තය/හිඟය (-)** .. .. | **-257·1** | **-231·9** | **33·7** | **127·6** |
| **(අ) ආදයම** .. .. .. .. .. | **954·0** | **952·5** | **1,026·2** | **1,158·6** |
| **(ආ) වියදම (එනම්, ණය ගැනීම් හෝ ණය දීම් ගනුදෙනුවල ශුද්ධ ලැබීම හෝ ගෙවීම අත්හැර මුළුගෙවීම්)** .. .. .. .. | **-1,211·1** | **-1,184·4** | **-992·5** | **-1,031·0** |
| (1) ආවර්තන වියදම (නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් ගෙවන අවක්‍ර රාජ්‍යණය බේරීම් හැර) (2 (ආ) (1) බලන්න*) .. .. .. | -1,004·6 | -893·5 | -772·0 | -864·9(අ) |
| (ආහාර ආධාර) .. .. .. .. | (247·8) | (127·0) | (12·0) | (36·0)(අ) |
| (2) ප්‍රාග්ධන වියදම්* .. .. .. .. | -203·0 | -220·6 | -162·3 | -215·5(අ) |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම .. | -7·7 | -6·4 | -3·2 | -2·1 |
| (4) ගබඩා තොග හා උපකරණ ගිණුමට අත්තිකාරම් .. | -16·8 | -2·4 | 4·6 | 9·9 |
| (5) අනෙකුත් අත්තිකාරම්* .. .. .. | 19·0 | -52·8 | -61·1 | 34·0 |
| (6) විවිධ .. .. .. .. .. | 2·0 | -8·7 | 1·5 | 7·6 |
| **හිඟය පියවීම** | | | | |
| **2. රජයේ ණය ගනුදෙනුවලින් උද්ගත වන ලැබීම් හා ගෙවීම් (ශුද්ධ) සහ විදේශීය දීමනා ලැබීම්** .. | **184·1** | **216·5** | **-35·3** | **-39·0** |
| **(අ) පාලන ණය ගැනීම් හා ණය ගෙවීම් (විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතුළුව)** .. .. | **-34·2** | **11·9** | **-4·6** | **29·1** |
| (1) තැන්පතු (නඩු කියන්නන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන් හා 1959/60ට වියදම් නොකොට ඉතිරි වී ඇති විදේශාධාර) .. .. | -16·2 | 21·4 | -2·1 | 34·5 |
| (2) විවිධ අරමුදල් (වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදල ආදිය) .. .. .. .. .. | 0·6 | -0·2 | 0·3 | -0·9 |
| (3) විවිධ ණය (කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය, ප්‍රාදේශීය ණය සංවර්ධන අරමුදල හා පළාත් පාලන මණ්ඩල ආදියට) .. .. | -18·6 | -9·3 | -2·8 | -4·5 |
| **(ආ) දේශීය වෙළෙඳ ණය ගැනුම් හා ගත් ණය ආපසු ගෙවීම්** .. .. .. .. | **218·3** | **204·6** | **-94·0** | **-80·2** |
| (1) රුපියල් ණය .. .. .. .. | 102·4 | 80·0 | 70·0 | 75·0 |
| නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් අත්හැර .. .. | 18·4 | 23·1 | 22·6 | 44·5 |
| | 84·0 | 56·9 | 47·4 | 30·5 |
| (2) භාණ්ඩාගාර බිල් .. .. .. | 62·3 | 90·6 | -78·1 | -44·9 |
| (3) මහ බැංකු අත්තිකාරම් .. .. .. | 72·0 | -1·5 | -4·7 | -65·8 |
| (4) බදු සංචිත සහතික .. .. .. .. | — | — | — | — |
| (5) අනෙකුත්† .. .. .. .. | — | 58·6 | 58·6 | — |
| **(ඇ) විදේශීය ආධාර** .. .. .. .. | **—** | **—** | **63·3** | **12·1** |
| (1) ණය .. .. .. .. .. | — | — | 63·3 | 12·1 |
| ආපසු ගෙවීම් අත්හැර .. .. .. | — | — | — | — |
| | — | — | 63·3 | 12·1 |
| (2) දීමනා .. .. .. .. .. | — | — | — | — |
| **3. මුදල් ශේෂයන්ගේ වෙනස්වීම් (පහසුවෙන් මුදල් කළ හැකි වත්කම් ඇතුළුව)** .. .. .. | **-73·0** | **-15·4** | **-1·6** | **88·6** |

* 1960–61 අය වැය ඇස්තමේන්තුවල ''ආදයමට අයවෙන වියදම්'' සහ ''ණය අරමුදල්වලට අය වෙන වියදම්'' යනුවෙන් වියදම් වර්ග කිරීමේ මෙතෙක් පැවති ක්‍රමය අත්හැර, ඒ වෙනුවට රජයේ මුළු වියදම්, පෞද්ගලික වැටුප්, පරිපාලන වියදම්, දෙපාර්තමේන්තු විසින් සැපයෙන සේවා, ආර්ථික සංවර්ධනය යන විසින් කොටස් හතරකට බෙදන ලදි. පසුව දක්වන ලද එක් එක් වර්ගය වර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් නැවත දෙවර්ගයකට බෙදන ලදි. මෙසේ රජයේ මුළු වියදම ශීර්ෂ හතකට බෙද දක්වා ඇත. මේ සටහනෙහි, වැය ශීර්ෂ 1, 2, 4 හා 6 යටතේ දක්වා ඇති පෞද්ගලික වැටුප් සහ වර්තන වියදම් ද, වැය ශීර්ෂ 3, 5, හා 7 යටතේ ප්‍රාග්ධන සඳහා වූ මුළු වියදම ද, වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වෙන් කොට දක්වා ඇත. 1960–61 වර්ෂයට පෙර වර්ෂය සඳහා මෙවැනි වර්ග කිරීමෙක් නොමැති නිසා, ආදයමට අයවෙන වියදම් හා ණය අරමුදල් වලට අයවෙන වියදම් වෙන වෙනම ආවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වලට සමානවෙතැයි සලකනු ලැබේ.

ගතවූ මුදල් වර්ෂ වලදී වැය වූ ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු 'වර්තන වියදමට' හා ප්‍රාග්ධන වියදමට මාරු කිරීමෙන් උද්ගතවන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩුවේ ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ.

†අර්ධ රාජ්‍ය නියෝජ්‍යත්වයන්ගෙන් ගත් ණය.

(අ) 1954–55 හේ ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට 1958–59 දී ආදයමට අය වෙන වියදමට මාරු කරන ලදි. මේ පොත් ගැලපිල්ල 1958--59 සංඛ්‍යාවන්ගෙන් ඉවත්කර තිබුන ද, (*සංලක්ෂ්‍යය බලන්න). 1954–55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කර ඇත.

# අතිරික්තය/හිඟය (—)

රුපියල් දශ ලක්ෂ

| 1955-56 | 1956-57 | 1957-58 | 1958-59 | 1959-60 | 1960-61 | 1961-62(ඇ) | 1962-63(ඈ) |
|---|---|---|---|---|---|---|---|
| – 1·2 | – 196·4 | – 222·3 | – 413·4 | – 417·5 | – 462·5 | – 456·1 | – 391·7 |
| 1,257·2 | 1,260·5 | 1,280·0 | 1,330·4 | 1,403·8 | 1,513·9 | 1,620·6(උ) | 1,593·4(උ) |
| –1,258·4 | –1,456·9 | –1,502·3 | –1,743·8 | – 1,821·3 | – 1,976·4 | – 2,076·6 | –1,985·3 |
| – 1,014·4 | –1,105·2 | – 1,280·1 | – 1,432·2 | – 1,511·9(ආ) | – 1,540·8(ආ) | – 1,580·7(ආ) | – 1,596·4(ආ) |
| (79·5) | (105·5) | (112·0) | (146·5) | (193·0) | (248·0) | (235·4) | (225·8) |
| – 211·0 | – 213·3 | – 282·6 | – 303·4 | – 306·6 | – 419·9 | – 480·6 | – 402·3 |
| – 4·0 | – 5·1 | – 3·0 | – 2·4 | – 1·5 | – 1·5 | – 0·7 | – 0·3 |
| 1·2 | – 14·5 | — | 10·5 | – 7·1 | 1·9 | 2·4 | – 8·6 |
| – 30·3 | – 115·8 | 54·5 | – 17·1 | 5·8 | – 15·9 | – 15·8 | 27·9 |
| 0·1 | – 3·0 | 8·9 | 0·8 | — | – 0·2 | – 1·2 | – 5·6 |
| 12·2 | 175·4 | 174·7 | 351·8 | 411·6 | 462·5 | 496·3 | 391·3 |
| – 36·5 | – 9·4 | 72·5 | 27·6 | 57·4 | 29·4 | 104·5 | – 33·8 |
| – 10·8 | 9·0 | 73·9 | 27·3 | 62·3 | 36·5 | 98·4 | – 28·0 |
| – 4·8 | – 2·3 | 20·1 | 4·2 | 2·7 | – 1·0 | 4·8 | 0·1 |
| – 20·9 | – 16·1 | – 21·5 | – 3·9 | – 7·6 | – 6·1 | 1·3 | – 5·9 |
| 43·5 | 166·2 | 78·5 | 291·2 | 327·6 | 406·5 | 336·0 | 331·6 |
| 74·5 | 94·9 | 45·0 | 95·0 | 134·8 | 214·9 | 145·0 | 205·0 |
| 39·0 | 31·1 | 26·5 | 29·7 | 30·6 | 32·1 | 37·9 | 40·4 |
| 35·5 | 63·8 | 18·5 | 65·3 | 104·2 | 182·8 | 107·1 | 164·6 |
| 8·0 | – 3·0 | 74·6 | 179·0 | 228·2 | 198·4 | 248·0 | 124·1 |
| — | 96·3 | – 13·8 | 41·1 | 3·1(ආ) | 20·6(ආ) | – 21·0(ආ) | 36·6(ආ) |
| — | 9·1 | – 0·8 | 5·8 | – 7·9 | 4·7 | 1·9 | 6·3 |
| — | — | — | — | — | — | — | — |
| 5·2 | 18·6 | 23·7 | 33·0 | 26·6 | 26·6 | 55·8 | 93·5 |
| 5·2 | 18·6 | 23·7 | 35·5 | 29·3 | 16·3 | 44·5 | 68·7 |
| — | — | — | 2·5 | 2·7 | 3·0 | 6·8 | 6·3 |
| 5·2 | 18·6 | 23·7 | 33·0 | 26·6 | 13·3 | 37·7 | 62·4 |
| — | — | — | — | — | 13·3 | 18·1 | 31·1 |
| 11·0 | – 21·0 | – 47·5 | – 61·7 | – 6·0 | ... | 40·2 | – 0·4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(ආ) 1959–60 දී ගෙවන ලද රුපියල් කෝටි 3·7 ක ජාත්‍යන්තර මුදල් මණ්ඩලයට වැඩි කළ දායක දීමනාවද, 1960–61 ජා.ප්‍ර.ස.බැ.ට සහ ජා.ස.ස. ට කළ රුපියල් කෝටි 0·22 ක ගෙවීමද, මහ බැංකුවෙන් ලත් විශේෂ ණයකින් ජා.ස.ස. ට කළ ගෙවීම බේරීමට 1961–62 දී දුන් රුපියල් කෝටි 0·02ක හා 1962–63 දී දුන් රුපියල් කෝටි 0·03ක්ද අත්හැර ඇත.

(ඇ) 1960–61 සිට, විදේශ දීමනාවලට අය වන ප්‍රාග්ධන වියදම්, අයවැය ලේඛනයට ඇතුළත් කැරිණි. 1960–61 ට පෙර විදේශීය දීමනා වලින් වියදම් නොකොට ඉතිරිව භාණ්ඩාගාරයේ මුදල් මාර්ගයක්ව පැවැති ශේෂ පමණක් පරිපාලන ණය ගැනීම් යටතේ ඇතුළත් කැරිණි.

(ඈ) 1961–62 හා 1962–63 ආදයම් සංඛ්‍යා, රජයේ ගිණුම්වල පළ කැරුන සංඛ්‍යා වලට වඩා වෙනසි. ඊට හේතු වනුයේ

(1) 1961–62 දී, රජයේ ගිණුම් වල ජාතික සංවර්ධන අරමුදලට බැර කිරීමක් සේ සැලකුන රුපියල් කෝටි 1·86ක ජාතික සංවර්ධන බදු ආදයම් යටතේ දක්වා ඇති අතර ජාතික ගංවතුර සහනාධාර අරමුදලෙන් ආදයමට පැවරුන රුපියල් කෝටි 2·06ක් ඇතුළත් කොට නොතිබීමත්, විදේශීය රාජ්‍ය හා නියෝජ්‍යත්ව මගින් ප්‍රදානය කරන ලදුව ආදයමට බැර කැරුන උපකරණ වල වටිනාකම වන රුපියල් කෝටි 0·39 ඇතුළත් නොකොට එය විදේශීය ආධාර (20(11) ශීර්ෂය) යටතේ දක්වා තිබීමත්, (11) ජාතික සංවර්ධන බද්දෙන් ලත් රුපියල් කෝටි 1·75ක් ආදයම් යටතේ ඇතුළත් කොට, විදේශීය රාජ්‍යයන් හා නියෝජ්‍යත්වයන් මගින් දෙන ලද උපකරණ වල හා අනෙකුත් ආධාර වල වටිනාකම වන රුපියල් කෝටි 0·28ක් ඇතුළත් නොකොට එය විදේශීය

1962/63 මුල් ඇස්තමේන්තු හා සසඳා බලන විට, නියම වශයෙන් ලැබී ඇති ආදයම රුපියල් කෝටි 12·35 කින් අඩු වී ඇත. මුල් ඇස්තමේන්තු වලට වඩා ලැබුන ආදයම පහළ වැටී ඇති ප්‍රමාණයන් මෙසේ ය:—ආනයන බදු රුපියල් කෝටි 10·85, අපනයන බදු රුපියල් කෝටි 0.29, ජාතික සංවර්ධන බද්ද රුපියල් කෝටි 0.71, අනෙකුත් ආදයම් රුපියල් කෝටි 0.6 ආදයම වැඩි වී ඇත්තේ ශීර්ෂ කිහිපයක පමණෙකි. (අධිභාරය ඇතුළුව) දුම්කොළ බද්දෙන් රුපියල් කෝටි 0.71 ක්ද ආදයම් බද්දෙන් රුපියල් කෝටි 0.68 ක්ද, කළුතෙල් රථ බද්දෙන් රුපියල් කෝටි 0.25 ක් ද ලැබී ඇති බව මෙහිලා සැලකිය යුතුය.

1962/63 නියම වශයෙන් ලැබුන ආදයමේ සහ 1961/62 නියම වශයෙන් ලැබුන ආදයමේ ඇති වූ වෙනස්කම් 1962/63 ඇස්තමේන්තු සමග සසඳා පහත දක්වා ඇත.

සංඛ්‍යා සටහන II උ—2

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 මුල් ඇස්ත මේන්තු | 1962/63 නියම (තාව කාලිකයි) | 1961/26 නියම | 1961/62ට වඩා 1962/63හි වෙනස (නියම) | මුල් ඇස්ත මේන්තු අනුව 1962/63ට (නියම) වූ වැඩිය (+) හෝ අඩුව (—) ඇස්තමේන්තු(අ) |
|---|---|---|---|---|---|
| 1. අපනයන බදු .. .. .. .. | 281·6 | 278·7 | 290·9 | –12·2 | – 2·9 |
| (අ) තේ (බද්ද ඇතුළුව) .. .. .. | 212·3 | 215·8 | 223·5 | – 7·7 | 3·5 |
| (ආ) රබර් .. .. .. .. | 35·3 | 29·3 | 30·2 | – 0·9 | – 6·0 |
| (ඇ) පොල් .. .. .. .. | 28·3 | 27·4 | 31·4 | – 4·0 | – 0·9 |
| 2. ආනයන බදු .. .. .. .. | 506·2 | 397·7(ආ) | 465·0 | –67·3 | –108·5 |
| (අ) කපු පිළි .. .. .. .. | 31·2 | 22·8 | 25·2 | – 2·4 | – 8·4 |
| (ආ) මත්පැන් .. .. .. .. | 15·6 | 9·3 | 14·2 | – 4·9 | – 6·3 |
| (ඇ) දුම්කොළ සහ සිගරට් .. .. .. | 66·0 | 46·1 | 51·9 | – 5·8 | – 19·9 |
| (ඈ) අනෙකුත් භාණ්ඩ .. .. .. | 207·0 | 148·3 | 191·9 | –43·6 | – 58·7 |
| 3. ආදයම් බද්ද (අධිභාරය හැර) .. .. | 210·0 | 217·2 | 231·9 | –14·7 | 7·2 |
| අධිභාරය .. .. .. | 42·0 | 41·6 | 30·5 | 11·1 | – 0·4 |
| 4. වියදම් ධන හා ත්‍යාග බදු .. .. .. | 15·0 | 12·4 | 11·6 | 0·8 | – 2·6 |
| 5. අරක්කු විකිණීමෙන් ලාභ .. .. .. | 98·0 | 98·0 | 72·0 | 26·0 | — |
| 6. දුම්කොළ බද්ද .. .. .. | 62·0 | 80·3 | 62·8 | 17·5 | 18·3 |
| 7. කළුතෙල් රථ බද්ද .. .. .. | 8·5 | 11·0 | 9·0 | 2·0 | 2·5 |
| 8. විදුලිය දෙපාර්තමේන්තුවේ ආදයම .. .. | 48·6 | 35·2 | 31·6 | 3·6 | – 13·4 |
| 9. ඉඩම් බද්ද .. .. .. | 12·0 | 11·2 | 11·7 | – 0·5 | – 0·8 |
| 10. වෘත්තීය හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ බද්ද .. | 7·0 | 1·0 | 3·2 | – 2·2 | – 6·0 |
| 11. කොටස් ප්‍රාග්ධනබද්ද .. .. .. | 3·5 | 1·4 | 2·1 | – 0·7 | – 2·1 |
| 12. වීසා බද්ද .. .. .. .. | 4·0 | 4·3 | 5·8 | – 1·5 | 0·3 |
| 13. 1961/62 අය–වැය ලේඛනයෙන් පැන වූ අළුත් බදු | | | | | |
| (අ) අලෙවි බද්ද (ක්‍රියාත්මක නොකැරිණි) .. | 0·1 | 0·1 | 0·1 | — | — |
| (ආ) ජාතික සංවර්ධන බද්ද .. .. | 25·0 | 17·9(ඇ) | 18·9(ඇ) | – 1·0 | – 7·1 |
| (ඇ) සලාක සහල්පොත් බද්ද .. .. | 5·0 | 3·7 | 3·9 | – 0·2 | – 1·3 |
| (ඈ) අධි බද්ද .. .. .. .. | 1·0 | 0·3 | ... | 0·3 | – 0·7 |
| 14. වෙනත් ආදයම් .. .. .. | 387·4 | 381·4 | 369·6 | 11·8 | – 6·0 |
| එකතුව .. .. .. | 1716·9 | 1596·4(ඇ) | 1620·6(ඇ) | –27·2 | –123·5 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) 1961/62 වර්ෂයේ දී නියම වශයෙන් ලැබුන ආදයමට වැඩියෙන් ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය රුපියල් කෝටි 15·6කින් වැඩි වූ අතර, 1960/61 දී එය රුපියල් කෝටි 12·0කින් වැඩි විය.

(ආ) බලපත්‍ර යටතේ ගෙන්වන භාණ්ඩ වලින් ලැබුණු රුපියල් කෝටි 0·84 ක බලපත්‍ර බදු ආදයම ඇතුළති.

(ඇ) පහත සඳහන් ගැලපිළි නිසා 1961/62 සහ 1962/63 ආදයම් සංඛ්‍යා රජයේ ගිණුම් හි පළකොට ඇති සංඛ්‍යා වලින් වෙනස් වෙයි. (i) 1961/62 දී ජාතික සංවර්ධන බද්දෙන් ලැබී රජයේ ගිණුම්හි ජාතික සංවර්ධන අරමුදලට බැර කිරීමක් වශයෙන් සැලැකැවුණු රුපියල් කෝටි 1·86 ක මුදලක් ආදයමට ඇතුළත් කොට ඇති අතර ජාතික ගංවතුර සහනාධාර අරමුදලෙන් ආදයමට කැරුන රුපියල් කෝටි 2·06 ක පැවැරුමක් එයට ඇතුළත් කොට නොතිබීම හා විදේශීය රාජ්‍යයන් හා නියෝජ්‍යත්වයන් විසින් ප්‍රදනය කරන ලදුව ආදයමට බැර කැරුන රුපියල් කෝටි 0·47ක උපකරණ වටිනාකම ආදයමට ඇතුළත් නොකොට විදේශීය දීමනා යටතේ දක්වා තිබීම. (ii) 1962/63 ජාතික සංවර්ධන බද්දෙන් ලැබුණ රුපියල් කෝටි 1·75 ක මුදලක් ආදයම යටතේ දක්වා ඇති අතර විදේශීය රාජ්‍යයන් හා නියෝජ්‍යත්වයන් විසින් ප්‍රදනය කැරුන උපකරණවල හා අනෙකුත් ආධාර වල වටිනාකම වන රුපියල් කෝටි 0·28 ආදයමට ඇතුළත් නොකොට විදේශීය දීමනා යටතේ දක්වා තිබීම.

අපනයන බදු වලින් ලැබුන ආදායම 1961/62 ලැබුන ආදායම හා සසඳන විට රුපියල් කෝටි 1·22 කින් අඩු විය. මෙයට හේතු වූයේ, තේ අපනයන බද්ද යටතේ ලැබුන ආදායම රුපියල් කෝටි 0.77 කින් අඩුවීම සහ පොල් අපනයන බද්දෙන් ලැබුනු ආදායම රුපියල් කෝටි 0.4 කින් අඩුවීමය. රබර් අපනයන බද්දෙන් ලැබුනු ආදායම රුපියල් කෝටි 0.09 කින් අඩුවිය. 1961/62 දී ලැබුන ප්‍රමාණයට වඩා 1962/63 දී තේ[1] අපනයන බද්දෙන් ලද ආදායම පහළ වැටීමට පහත එන කරුණු හේතු වූවා විය හැකිය. (අ) කොළඹ වෙන්දේසියේ පැවැති සාමාන්‍ය මිල අඩුවීම නිසා ''මිල පමණට ලැබෙන'' බදු අනුපාතිකය අනුව ලැබුන ආදායම අඩුවීම. (ආ) 1963 අප්‍රේල් මාසයේ සිට, ත්‍රිකුණාමලයේ සහ ගාල්ලේ වරාය වලින් පටවන ලද තේ සඳහා ලැබෙන බද්දෙන් හැම රාත්තලක් සඳහා ම සත 2 ක් අඩුකිරීම, (ඇ) තේ අපනයන පරිමාව රාත්තල් කෝටි .25 කින් වැඩිවීම නිසා බදු වශයෙන් ලැබිය යුතු වැඩි ආදායම, ඉහත (අ) සහ (ආ) වල ඒකාබද්ධ බලපෑම නිසා මැකීයාම. මේ මුදල් වර්ෂයේදී අපනයන කරන ලද රබර්[2] පරිමාව ප්‍රමාණ වත් ලෙස රාත්තල් කෝටි 2.16 කින් වැඩි වුවද, අවුරුද්ද තුළ මිල පහළ මට්ටමක පැවැති නිසා අපනයන බදු වශයෙන් ලද ආදායම ද අඩු විය. අපනයන පරිමාව වැඩිවීම නිසා ලැබුන වාසිය, සාමාන්‍ය මිල පහළ වැටීම නිසා මැකී ගියේය. පොල් අපනයන බදු වලින් ලැබුන ආදායම අඩු වීමට ප්‍රධාන හේතුව වූයේ අපනයන පරිමාව අඩුවීමය. 1961/62 දී පොල් තෙල් ටොන් 1,02,300 ක් අපනයන කැරුනද 1962/63 දී එය, තෙල් ටොන් 84,100 ක් දක්වා අඩු විය. කොප්පරා අපනයන ද සම කාලය තුළ දී ටොන් 21,600 කින් අඩු වූ අතර, කපාපු පොල් ටොන් 2,500 කින් අඩු විය. එහෙත් අපනයන පරිමාව අඩුවීම නිසා රජයේ ආදායම කෙරෙහි ඇති වූ බලපෑම 1962/63 දී මිල සතුටු දයක වීම නිසා බදු වශයෙන් ලැබුන ප්‍රමාණය වැඩිවීමත් තරමක් දුරට අඩුවී ගියේය. එහෙත්, අපනයන පරිමාව, අඩුවීම නිසා අඩු වූ ආදායම පිරිමසාලීමට වැඩි වූ මිල තරම් නොවීය.

ඉහත සඳහන් කළ පරිදි, පසුගිය වර්ෂය හා සසඳන විට, 1962/63 දී ආනයන බදු වලින් ලද ආදායම රුපියල් කෝටි 6·73කින් අඩු විය. ''අනෙකුත් භාණ්ඩ'' යටතේ වර්ග කොට ඇති මත්පැන් සහ කපු පිළි වලින් ලද ආදායම රුපියල් කෝටි 6·09 කින් අඩුවිය. 1962-අය-වැය ලේඛනයෙන් දුම්කොළ සහ සිගරැට් සඳහා වූ බදු අනුපාතිකය වැඩි කිරීම නිසා බදු වශයෙන් රුපියල් කෝටි ·42 ක මුදලක් වැඩිය ලැබීමෙන් මේ පාඩුව තරමක් දුරට මැකී ගියේය. එහෙත්, 1961/62 වර්ෂයේ ''අනෙකුත් භාණ්ඩ'' යටතේ ලැබුන ශුද්ධ ආදායම රුපියල් කෝටි 3·24 කින් වැඩිවිය. එහෙත් 1962/63 මේ ගණය යටතේ ලද ආදායම රුපියල් කෝටි 4.36 කින් අඩුවිය. මෙයට හේතු වූයේ විදේශීය වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා කෙළින් ම ආනයන ප්‍රමාණය කපා හැර ආනයන බිල අඩු කර ගැනීම සඳහා 1962 දී අය වැය ලේඛනයෙන් දැරූ ප්‍රයත්නය විය.

අයි බද්ද ඇතුළුව 1962-63 ආදායම් බදු වලින් ලැබුන ආදායම 1961/62 නියම වශයෙන් ලැබුන ආදායමට වඩා රුපියල් කෝටි 0.4 කින් අඩුවිය. මේ සඳහා ප්‍රධාන අපනයන කෘෂිභෝග දෙවග වන, තේ සහ රබර් වල, මිල අඩුවීම නිසා හෝ, නිෂ්පාදන වියදම වැඩිවීම නිසා හෝ, නිෂ්පාද කයන්ගේ ලාභය අඩුවීමෙන් මුදල් ආදායම අඩුවීම, ආදායම මෙසේ අඩුවීම සඳහා දියහැකි හේතුවක් වශයෙන් දක්විය හැකිය. 1961/62 දීට වඩා 1962/63 දී බදු වලින් ලැබුනු මුදල් ප්‍රමාණය අඩුවීමට දක්විය හැකි තවත් හේතුවක් නම්, බදු ගෙවීම පැහැර හැරීම විය හැකිය. එහෙත්, බදු ගෙවීම පැහැර හැරීම නිසා බදු ආදායම කෙතරම් අඩුවී ද යන්න ඇස්තමේන්තු කිරීම දුෂ්කරය. එහෙත්

---

1. 1959 ජූනි මාසයේ සිට කොළඹ වෙන්දේසියේ තේ රාත්තලකට ලැබෙන මිල රු. 1·85කට වැඩි වන විට වැඩි වන ප්‍රමාණය සියයට 50ක බද්දකට යටත් වෙයි. අය කළ හැකි උපරිම බද්ද සත 70කි. මිල පමණට අයකැරෙන ඉහත සඳහන් බද්දට අමතරව රාත්තලකට සත 35ක නියමිත අපනයන බද්දක් අය කැරිණි.

2. 1963-11-28 වැනි දින සිට රබර් සඳහා බදු වෙනස්වන මිල පදනම් කොට නියම කොට ඇත.

මෙහිදී තවත් සිහිතබා ගත යුතු කරුණෙක් වෙයි. එනම්, හිඟ අය වැය ක්‍රමය නිසා ඇති වූ රජයේ මුදල් පරිහරණයත්, වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ලද ණය ගනුදෙනුත් මුදල් ආදයම අඩුවීම නිසා ඇති වූ සංකෝචන බලපෑම තරමක් මකාලීමෙන් මේ ශීර්ෂය යටතේ ආදයම් අඩුකිරීමෙහි ලා ඇති වූ බලපෑම සමභාග කරලීමට උපකාරී වූවා විය හැකිය.

ශීර්ෂ දෙකක් යටතේ ලැබුන ආදයම සාමාන්‍යයෙන් වැඩි විය. මෙයට අරක්කු වෙළෙඳාම සහ දුම්කොළ බද්ද ඇතුළත් විය. අරක්කු වෙළෙඳාමෙන් රුපියල් කෝටි 2·6 ක් ලැබුන අතර, දුම්කොළ බද්දෙන් රුපියල් කෝටි 1·75 ක් ලැබිණි. අරක්කු විකිණීමෙන් ලැබුන ලාභය වැඩි වීමට හේතු වූයේ 1962/63 ආදයමට පසුගිය වර්ෂයේ එකතු වූ ලාභ වලින් රුපියල් කෝටි 1·8ක් එකතු කිරීමත්, වෙළෙඳාම වැඩිවීම නිසා ආදයම වැඩිවීමත්‍ය. දුම්කොළ වලින් ලැබුන ආදයම වැඩි වූයේ දුම්කොළ පාවිච්චිය වැඩිවීම නිසාය. 1961 ජූලි මාසයේ දී දුම්කොළ බද්ද රාත්තලකට රු. 20 සිට රු. 28 දක්වා වැඩි කළ ද, දුම්කොළ පාවිච්චිය රාත්තල් 6,27,000 කින් වැඩි විය.

## වර්තන වියදම්

1960/61 සිට 1963/64 තෙක් වර්ෂ වල වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II උ—3

**රජයේ වියදම**

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වර්තන වියදම (1) | ප්‍රාග්ධන වියදම් (2) | | |
|---|---|---|---|---|
| | | මූර්ත වත්කම් අත්කර ගැනීම නිර්මාණය සහ පවත්වාගෙන යාම | රාජ්‍ය නියෝජ්‍යත්වයන්ට දුන් ණය | එකතුව |
| 1960/61 .. .. .. | 1471·3 | 471·9 | 47·2 | 519·1 |
| 1961/62 .. .. .. | 1498·1 | 499·4 | 86·2 | 585·6 |
| 1962/63 (මුල් ඇස්තමේන්තු | 1585·4 | 560·5 | 9·8 | 570·3 |
| (නියම, තාවකාලික) | 1524·9 | 485·9 | 10·0 | 495·9 |
| 1963/64 (මුල් ඇස්තමේන්තු) | 1660·7 | 608·8 | 30·6 | 639·4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1962/63 නියම වර්තන වියදම් පිළිබඳ තාවකාලික සංඛ්‍යා අනුව, එම වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලට වඩා එය රුපියල් කෝටි 6.05 කින් අඩු වී ඇති බව පෙනේ. එහෙත්, 1962/63 නියම වියදම (තාවකාලිකව) 1961/62 වියදමට වඩා රුපියල් කෝටි 2.68 කින් වැඩිය. 1960/61 දීට වඩා 1961/62 දී එය රුපියල් කෝටි 2.68 කින් වැඩි විය. 1959/60 දී වර්තන වියදම රුපියල් කෝටි 9.10 කින් වැඩි වූ අතර 1960/61 දී එය රුපියල් කෝටි 10.59 කින් වැඩි විය. පසුගිය මුදල් වර්ෂයේ මෙන්ම, 1962/63 දීත් වර්තන වියදම සුළු වශයෙන් වැඩි වීමට හේතු වූයේ ආහාර ආධාරය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් අඩු ප්‍රමාණයක මුදලක් වැය කිරීමය. රාජ්‍ය ණය සඳහා පොළී වශයෙන් ගෙවූ ප්‍රමාණයත් අධ්‍යාපනය සහ විශ්‍රාම වැටුප් ප්‍රමාණයත් වැඩි වුවද, ආහාර ආධාර සඳහා ගෙවූ මුදල් අඩුවීම නිසා එයද තරමක් මැකී ගියේය.

---

1 වර්තන වියදම ලබා ගන්නේ නිදන් අරමුදල් දීමනා නැවත අවක්‍ර ගෙවීම් සහ ප්‍රාග්ධන ස්වරූපීය වියදම්, (නඩත්තු වියදම් සහ කල් පවත්නා භාණ්ඩ මිලට ගැනීම) පූනාවර්තන වියදම් වලින් (1, 2, 4 සහ 6 වැනි ශීර්ෂ) අඩු කිරීමෙනි.

2 ප්‍රාග්ධන වියදම් ලෙස සැලකෙන්නේ, අවුරුද්දකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගත හැකි වත්කම්, නිර්මාණය ලබා ගැනීම හා නඩත්තුව සඳහා යන වියදම් සහ මූල්‍ය වත්කම් අත්කර ගැනීමේ වියදම් ය. මෙයට ප්‍රධාන වශයෙන් ලං.ග.ම. යට වරාය සංයුක්ත මණ්ඩලයට දේශීය ණයවලට හා සංවර්ධන අරමුදලට දෙන ණය ගැනේ. ප්‍රාග්ධන වියදම්වලට සංවර්ධනයට නො ගැනෙන සමහර වියදම් ඇතුළත් වන නිසාත්, සංවර්ධනයට ගැනෙන සමහර වර්තන වියදම් ඇතුළත් නොවන නිසාත් ප්‍රාග්ධන වියදම් සංවර්ධන වියදම් හා සැසැඳෙන්නේ නොවේ. ප්‍රාග්ධන වියදම් වලට ප්‍රාග්ධන වැය ශීර්ෂ (3, 5, සහ 7) යටතේ ගැනෙන වියදම් ද, විදේශීය ආධාර, ණය සහ දීමනා වලින් වන වියදම් ද, වර්තන වියදම්වලට ප්‍රාග්ධන ශීර්ෂ තේ හා රබර් නැවත වගා කිරීමේ ආධාර, විදුලි දෙපාර්තමේන්තුවේ සංචිත වියදම්, අධි අය වැය ලේඛන වියදම් ගැනේ. අධි අය වැය ලේඛන වියදම් 1960/61 කෝටි 2·83, 1961/62 කෝටි 2·18. 1962/63 කෝටි 2·40 (ඇස්තමේන්තු) සහකෝටි 2·19 (තාව කාලික) සහ 1962–63 කෝටි 4·91 ක් ද විය.

1962/63 ආහාර ආධාරය සඳහා රුපියල් කෝටි 22·58 ක් (ශුද්ධ) වැය විය. 1961/62[1] දී එය රුපියල් කෝටි 23·54 ක් විය. 1960/61 දී මෙය රුපියල් කෝටි 24·80 ක් ද, 1959/60 දී රුපියල් කෝටි 19·3ක් ද, 1958/59 දී රුපියල් කෝටි 14·65 ක් ද විය. ආහාර ආධාර මුළු වර්තන වියදම් වල සියයට ගණනක් වශයෙන් පළ කරන්නේ නම්, එය 1962/63 දී සියයට 14·8 ක් ද, 1961/62 දී සියයට 15·7 ක් ද, 1960/61 දී සියයට 16·9 ක් ද වී ඇත. අත්තිකාරම් ගිණුම් වලින් ලබාගත් රුපියල් කෝටි 1.27 ක් ද ඇතුළුව ආහාර ආධාරය සඳහා වූ ශුද්ධ වියදම, වන රුපියල් කෝටි 23.85 වැඩිවූ ආධාර සමග ගලපා, මුළු වර්තන වියදම්වල සියයට ගණනක් වශයෙන් දක්වන්නේ නම් එය සියයට 15.5 ක් වෙයි.

1962/63 ආහාර ආධාර වියදම් සම්බන්ධයෙන් ආහාර කොමසාරිස් විසින් සපයා ඇති තාවකාලික සංඛ්‍යා තොරතුරු සහ 1961/62 නියම වශයෙන් වැය වූ ප්‍රමාණයන් බෙද II ළ 4 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. අවුරුදු අතර ඇතිවූ වෙනස්කම් ද දක්වා ඇත.[2]

සංඛ්‍යා සටහන II ළ—4

## 1962/63 ආහාර ආධාර වියදම 1961/62 වියදම සමග සසඳනවිට

රුපියල් දශ ලක්ෂ

| | 1962/63* | 1961/62 | වෙනස |
|---|---|---|---|
| 1. ආනයන කළ සහල් විකිණීමෙන් (ආධාර) පාඩුව† .. | 126·5 | 125·2 | − 1·3 පාඩු වැඩිවීම |
| 2. මෙරට සහල් විකිණීමෙන් (ආධාර) පාඩුව† .. | 278·5 | 268·5 | − 9·8 පාඩු වැඩිවීම |
| 3. බෙදහැරීමේ හා අනෙකුත් වියදම් .. .. | 28·0 | 26·3 | − 1·7 පාඩු වැඩිවීම |
| 4. එකතුව (1 සිට 3) .. .. .. .. | 433·0 | 420·2 | |
| 5. සීනි විකිණීමෙන් ලාභ .. .. .. .. | 142·4 | 156·8 | −14·4 ලාභ අඩුවීම |
| 6. පිටි විකිණීමෙන් ලාභ .. .. .. .. | 26·1 | 29·4 | − 3·3 ලාභ අඩුවීම |
| 7. අනෙකුත් භාණ්ඩ .. .. .. .. | 25·9 | 3·4 | +22·5 ලාභ වැඩිවීම |
| 8. එකතුව (5 සිට 7) .. .. .. .. | 194·4 | 189·6 | |
| 9. මුළු ශුද්ධ ආධාරය (4 න් 8 අඩුකොට) .. .. | 238·5 | 230·7 | + 7·8 පාඩු වැඩිවීම |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

*තාවකාලිකයි

1. සංඛ්‍යා භාණ්ඩාගාරයේ ලෙජර්වල ඇති පරිද්දෙනි. ආහාර ආධාර වියදම් (ශුද්ධ) සම්බන්ධයෙන් ආහාර කොමසාරිස් විසින් සපයා ඇති සංඛ්‍යා පහත දක්වා ඇති හේතූන් නිසා භාණ්ඩාගාර සංඛ්‍යාවලින් වෙනස් වෙයි. ආහාර කොමසාරිස්ගේ සංඛ්‍යා අනුව, 1961/62 මුළු ආහාර ආධාර වැය රුපියල් කෝටි 23·07කි. මෙය 1961/62 භාණ්ඩාගාර සංඛ්‍යා සමග සසඳන විට, රුපියල් කෝටි 0.47 කින් අඩුය. මේ මුදල් ආහාර කොමසාරිස්ගේ ගිණුම් විධිමත් පරිදි විගණනය කළ පසු වසරක දී රජයේ ආදයමට බැර කරනු ලැබේ. මෙසේම 1962/63නේ ආහාර ආධාරය සඳහා ආහාර කොමසාරිස් විසින් දී ඇති තාවකාලික ඇස්තමේන්තුව රුපියල් කෝටි 23·85 ක් වෙයි. මෙය 1961/62 නියම සංඛ්‍යා වලට වඩා රුපියල් කෝටි 0·78කින් වැඩිය. භාණ්ඩාගාර සංඛ්‍යාවට වන රුපියල් කෝටි 22.58 අතරත්, ආහාර කොමසාරිස්ගේ සංඛ්‍යාව වන රුපියල් කෝටි 23·85 අතරත් වෙනස වන රුපියල් කෝටි 1.27 ඇති වීමට හේතු වූයේ අනුපූරක ඇස්තමේන්තුව සම්මත නොවූ නිසාය. 1962/63 වර්ෂය සඳහා භාණ්ඩාගාර සංඛ්‍යා වන රුපියල් කෝටි 22·58 අතර සහ 1962/63 සම්බන්ධයෙන් ඇති වූ නියම වියදම අතර වෙනස අත්තිකාරම් ගිණුම් යටතේ මුදල් ලබා ගැනීමෙන් ගලපා ගනු ලැබේ.

2. සංඛ්‍යා දෙවර්ගය කෙළින්ම සැසඳීම සාධාරන වන්නේ තාවකාලික සංඛ්‍යාවට නියම සංඛ්‍යාවෙන් සැලකිය යුතු පරිදි වෙනස් නොවන්නේ නම් පමණෙකි.

† සහල් ආධාරය නිසා වන පාඩුව, (ඒකකයකට) ගුණනය කරන්නේ මෙසේය.

(අ) ආනයන කරන සහල් විකිණීමෙන් වන පාඩුව (ආධාරය) වශයෙන් සැලකෙන්නේ එම සහල් ගොඩ බාන විට රජයට වන මිල සාමාන්‍යයත් බලයලත් (සිල්ලර) බෙද හරින්නාට විකුණන මිල සාමාන්‍යයත් අතර ඇති වෙනසය. ගොඩබාන මිලට, මිලත්, ගැල්කුලියත්, ගබඩාවට යවන තෙක් වන අනෙකුත් වියදමුත් ඇතුළත් වෙයි.

(ආ) මෙරට සහල් විකිණීමෙන් වන පාඩුව (ආධාරය) වශයෙන් සැලකෙන්නේ, මෙරට සහල් ගැනීමේදී රජයට වන මිලත්, එම සහල් බලය ලත් (සිල්ලර) බෙදහරින්නාට, විකිණීමේදී වන මිලත් අතර ඇති වෙනසය.

ආනයන සහල් වලින් වන පාඩුව පාරිභෝගිකයාට දෙනු ලබන ආධාරයක් වන අතර, මෙරට සහල් වලින් ඇතිවන පාඩුව, පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට යන දෙදෙනාටම දෙන ආධාරයකි.

ආනයන කළ සහල් විකිණීමෙන් ලද පාඩුව 1962/63 දී වැඩිවීමට හේතු වූ එක්තරා කරුණක් වශයෙන් සහල් ගොඩබාන විට ඇති වන මිල වැඩිවීම දැක්විය හැකිය. 1961/62 වර්ෂයේ දී බුරුම හාල් දිග් ටොන් එකක ගොඩබාන මිල සාමාන්‍යය, රුපියල් 535 ක් විය. 1962/63 දී එය රුපියල් 546 ක් විය. මේ අනුව දිග් ටොන් එකක් රුපියල් 11 කින් වැඩි විය. චීනයෙන් ගෙන්වන සහල් ගොඩබාන මිල මෙයටත් වඩා වැඩි වූයේ, 1961/62 දී රුපියල් 515 ක් වූ අතර, 1962/63 දී රුපියල් 541ක් විය. මේ අනුව දිග් ටොන් එකකට රුපියල් 26 ක් වැඩි වී ඇත. මෙරට හාල් වලින් ඇතිවූ පාඩුව වැඩිවූයේ, මෙරට හාල් වැඩියෙන් මිලට ගැනීම සහ විකිණීම නිසාය.

සීනි විකිණීමෙන් ලද ලාභය අඩුවීමට හේතු වූයේ, සීනි ගන්නා මිල වැඩිවූ අතර සිල්ලර වශයෙන් විකුණන මිලෙහි වෙනසක් නොකිරීමත් නිසාය. 1962/63 දී සුදු සීනි දිග් ටොන් එකක් ගොඩබාන මිල සාමාන්‍යය රුපියල් 1,193 ක් විය. 1961/62 දී පැවැති මිල රු. 500 ක් පමණෙකි. මේ අනුව සීනි වල ගොඩබාන සාමාන්‍ය මිල දෙගුණයකටත් වැඩි වී ඇති බව පෙනේ. පසුගිය අවුරුද්දේ අඩු මිලකට ගත් සීනි තොග නොතිබෙන්නට, සීනි විකිණීමෙන් ලද ලාභ මෙයටත් වඩා අඩු වන්නට තිබිණි. මේ තොග ද විකිණීම නිසා නිසැකවම සීනි විකිණීමෙන් ලබන ලාභය එපමණට ම අඩු නොවූ අතර, ආහාර ආධාර වියදම ද වැඩි නොවීය.

ඕස්ට්‍රේලියාවෙන් මිලට ගනු ලබන පිටි වල මිල 1960/61 සහ 1961/62 දී නොවෙනස්ව දිග් ටොන් එකක් රු. 461 ක් ව තුබුන ද, 1962/63 වර්ෂයේදී එය රුපියල් 20 කින් වැඩි වූයේ රුපියල් 481 ක් විය.

1962/63 සහතික මිල ක්‍රමය යටතේ, ගනු ලැබූ වී ප්‍රමාණය බුසල් 2,55,15,945 ක් විය. මෙය 2,50,65,890 හා සසඳන විට බුසල් 4,50,055කින් වැඩිය.

**ප්‍රාග්ධන වියදම**

1962/63 මුළු ප්‍රාග්ධන වියදම, (අයවැය ලේඛන වැය ශීර්ෂ 3, 5 සහ 7 එකතුව) රුපියල් කෝටි 40·23 ක් විය. මේ සංඛ්‍යා වලට, තේ සහ රබර් නැවත වගා කිරීමේ අයවැය ලේඛන යෙන් බාහිර, වියදම් සහ අයවැය ලේඛනයේ ප්‍රාග්ධන ශීර්ෂ එකතු කළ විට, 1962/63 ප්‍රාග්ධන වියදම් රුපියල් කෝටි 49·59 ක් වෙයි. (තාවකාලික සංඛ්‍යා) මෙය අවුරුද්දේ මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් කෝටි 7·44 කින් අඩු වන අතර, 1961/62 නියම වියදම් වලට වඩා රුපියල් කෝටි 8·97 කින් අඩුය. පවරා ගැනීම්, ඉදි කිරීම් සහ මූර්ත වත්කම් නඩත්තුව සඳහා කැරුන ප්‍රාග්ධන වියදම් රුපියල් කෝටි 1·35 කින් අඩු විය. රජයේ නියෝජ්‍යාත්ව වලට දෙන ලද ණය 1962/63 දී, 1961/62 දීට වඩා රුපියල් කෝටි 7·62 කින් අඩු විය. පවරා ගැනීම්, ඉදි කිරීම් සහ මූර්ත වත්කම් නඩත්තුව, සම්බන්ධයෙන් කැරුන ප්‍රාග්ධන වියදම් අඩු වී ඇත්තේ ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය, වාරිමාර්ග සහ ධීවර කර්මාන්තය සම්බන්ධයෙනි. රජයේ නියෝජ්‍යාත්ව වලට දෙන ලද ණය අඩු වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම ලංකා ගමනාගමන මණ්ඩලයට සහ වරාය සංයුක්ත මණ්ඩලයට අඩු වශයෙන් ණය දීමෙනි.

**අත්තිකාරම් ගිණුම් ගනුදෙනු**

1962/63 අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වලින් රුපියල් කෝටි 1·37 ක් (ශුද්ධ) ලැබී ඇති අතර, 1961/62 දී රුපියල් කෝටි 1·46ක ගෙවීමක් ඇති විය. මෙසේ ලැබීමක් ඇති වූයේ ආහාර ආධාරය සඳහා ඒකාබද්ධ අරමුදලින් වැය කළ නොහැකි වූ රුපියල් කෝටි 1·27 ක් ගෙවීමෙන් ද පසුවය. රුපියල් කෝටි 1.37 ක (ශුද්ධ) ලැබීමක් ඇතිවීමට ප්‍රධාන හේතුව වූයේ, ලංකාව සහ චීනය අතර ඇති වෙළෙඳ ගෙවීම් ගිවිසුම යටතේ, එකතු වී තුබූ වෙළෙඳ ශේෂය රුපියල් කෝටි 2.03 කින් අඩුවීමය. චීන ගිණුමෙහි ලංකාවට තුබූ බැර ශේෂය, වර්ෂය තුළ චීනයෙන් ලංකාවට ගෙන්වන ලද සහල් සඳහා ගෙවීමට ප්‍රයෝජනයට ගනු ලැබීය.

**හිඟය පියවීම**

අයවැය හිඟය පියවා ගැනීමට මුදල් ලබාගත් මාර්ග සහ ඉන් ඇති වූ ප්‍රාසාරණාත්මක බලපෑම පසුගිය වසරේ සමානුරූප සංඛ්‍යා සමග පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II උ—5

## හිඟය පියවූ ආකාරය

රුපියල් දශ ලක්ෂ

| | 1961/62 | | | 1962/63 (තාවකාලිකයි) | | |
|---|---|---|---|---|---|---|
| 1. පරිපාලන ණයගැනීම් .. .. .. .. | | | 104·5 | | | −33·8 |
| 2. විදේශ මුදල් (අ) ණය .. .. .. | | | | | | |
| (1) ණයට ගත් ප්‍රමාණය (දළ) .. | 44·5 | | | 68·7 | | |
| (2) නැවත ගෙවීම් හැර .. .. | 6·8 | 37·7 | | 6·3 | 62·4 | |
| (ආ) දීමනා .. .. .. | | 18·1 | 55·8 | | 31·1 | 93·5 |
| 3. බැංකු නොවන, දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය .. | | | | | | |
| (අ) ණයට ගත් ප්‍රමාණය දළ වශයෙන් .. .. | 147·3 | | | | 193·9 | |
| (ආ) නිදන් අරමුදල් දීමනා හැර .. .. .. | 37·9 | 109·4 | | | 40·4 | 153·5 |
| 4. දේශීය වෙළෙඳ පොළේ බැංකු ක්‍රමයෙන් ගත් ණය .. | | 226·6 | | | | 178·1 |
| 5. රජයේ මුදල් ශේෂ අඩුවීම් (—ලකුණ වැඩිවීමක් දක්වයි) | | −40·2 | | | | 0·4 |
| 6. ශුද්ධ—අයවැය හිඟය .. .. .. .. | | 456·1 | | | | 391·7 |
| 7. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශවීය අරමුදල් අඩුවීම (—ලකුණ වැඩිවීමක් දක්වයි) .. .. .. | | 4·0 | | | | −16·5 |
| 8. අයවැය ලේඛනයේ ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම .. (4 + 5 + 7) | | 190·4 | | | | 162·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1962/63 අයවැය ලේඛනයෙන් රුපියල් කෝටි 46·33 ක් වූ අයවැය හිඟය පියවා ගැනීමේ මාර්ග වශයෙන්, දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් කෝටි 18 ක් ද, විදේශ ආධාර වලින් රුපියල් කෝටි 15 ක් ද ලබා ගැනීමට මුදල් ඇමති තුමා සඳහන් කළේය. මේ අනුව රුපියල් කෝටි 13·33 ක නොපියවුන හිඟයක් විය. 1962/63 සඳහා ඇස්තමේන්තු කළ ශුද්ධ අයවැය හිඟය රුපියල් කෝටි 41·33 ක් විය. එහෙත් මේ කොටසේ ඉහත සඳහන් කළ හේතූන් නිසා ඇති වූ තත්‍ය අයවැය හිඟය රුපියල් කෝටි 39·17 ක් විය. ශුද්ධ අයවැය හිඟය මෙසේ අඩු වීමත් සමග බැංකු නොවන දේශීය මාර්ග වලින් ගත් ණය වැඩිවීම නිසා මෙරට බැංකු ක්‍රමයෙන් ගනු ලබන ණය ප්‍රමාණය අඩු කරලීමට ඉවහල් විය. ප්‍රාසාරණාත්මක මාර්ග වලින් එතරම් මුදල් ලබා නොගැනීමෙන් හෙළි වන පරිදි මූල්‍ය තත්ත්වයේ ඇති වූ දියුණුව මුදල් ශේෂ ඉතා සුළු වශයෙන් රුපියල් කෝටි 0·04 කින් අඩුවීමෙන් හා පරිපාලනය ණය ගැනීම් යටතේ රුපියල් කෝටි 3·38 නැවත ගෙවීමෙන් තවත් පැහැදිළි වෙයි.

අයවැය ලේඛනයේ (ශුද්ධ) ප්‍රාසාරණාත්මක බලපෑම (ඇ.එ.ජ. ආධාර ප්‍රතිපාර්ශවීය අරමුදල් වල වෙනස් වීම සඳහා ගැලපූ විට) රුපියල් කෝටි 16·20 ක් වූයේ පසුගිය වසරට වඩා අඩු විය. මෙය 1961/62 දී රුපියල් කෝටි 19·04 ක් වූ අතර, 1960/61 දී රුපියල් කෝටි 23·39 ක් සහ 1959/60 දී රුපියල් කෝටි 25·11 ක් විය.

බැංකු ක්‍රමයෙන් ණයට ගත් ප්‍රමාණය රුපියල් කෝටි 17·81 ක් විය. මෙය පසුගිය මුදල් වර්ෂයේ ප්‍රමාණය හා සසඳන විට, සතුටුදායකය. 1962/63 ණයට ගනුලැබූ මුළු මුදලින් රුපියල් කෝටි 15·62 ක්ම මහ බැංකුවෙන් ගනු ලැබීය. වෙළෙඳ බැංකු වලින් ගනු ලැබුයේ රුපියල් කෝටි 2·2 කි.

මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 3·66 කින් වැඩි වුන අතර, මහ බැංකුව විසින් මිලයට ගනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 12·45 ක් විය. වෙළෙඳ බැංකු මිලයට ගත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 2·75 ක් වූ අතර, 1961/62 දී එය රුපියල් කෝටි 4·2 ක් විය. වෙළෙඳ බැංකු සතු රුපියල් සුරැකුම්පත් රුපියල් කෝටි 0·54 කින් ද බඳු සංචිත සහතික රුපියල් කෝටි 0·01 කින් ද අඩු විය.

1962/63 දී ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුන විදේශාධාර, රුපියල් කෝටි 9·98 ක් විය. 1961/62 දී මෙය රුපියල් කෝටි 6·26 ක් වූ අතර, 1960/61 දී රුපියල් කෝටි 2·96 ක් සහ 1959/60 දී රුපියල් කෝටි 3·86 ක් විය. පසුගිය සිව් වසර තුළ ගෙවන ලද විදේශීය ණය පිළිවෙළින් රුපියල් කෝටි 0·63, කෝටි 0·68, කෝටි 0·3 ක් සහ කෝටි 0·27 ක් විය. ලැබුන විදේශාධාර සහ දීමනා (ශුද්ධ) වැඩිවීම සහ එවැනි විදේශාධාර වැඩි වැඩියෙන් ආයෝජනයට ගනු ලැබූ බව දක්වුනද, මුලින් බලාපොරොත්තු වූ ප්‍රමාණය සහ තත්‍ය වශයෙන් ලැබුන ප්‍රමාණය අතර සැලකිය යුතු වෙනසෙක් ඇති විය. ලැබෙන විදේශාධාර ප්‍රමාණය ඒ හා සමාන ප්‍රාග්ධන වියදමක් සඳහා වෙන් කොට ඇති විට, අයවැය හිඟය පියවීම කෙරෙහි, විදේශාධාර අඩුවීම වැඩි වෙනසක් ඇති කරන්නේ නොවේ. එහෙත් ප්‍රාග්ධන සම්පාදනය හා ආර්ථික වර්ධනය අතින් සලකන විට ආධාර අඩු වශයෙන් යෙදවීම සැලකිලි වන්ත විය යුතු කරුණෙකි.

1962-63 ලැබුන විදේශාධාර විස්තර පහත දක්වේ.

සංඛ්‍යා සටහන II උ—6

## 1962/63 ලැබුන විදේශාධාර

රුපියල් දශ ලක්ෂ

| | ලැබුණු ප්‍රමාණය | ගෙවන ලද ප්‍රමාණය | වර්ෂය තුළ ලැබුන ප්‍රමාණය ශුද්ධ |
|---|---|---|---|
| **ණය** | | | |
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව .. | 25·3 | 4·1 | 21·2 |
| කැනඩාව .. .. .. .. .. | 2·0 | 1·2 | 0·8 |
| එක්සත් රාජධානිය .. .. .. .. | 12·0 | 0·1 | 11·9 |
| ඇමරිකා එක්සත් ජනපදය .. .. .. | 0·2 | 0·9 | –0·7 |
| එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව .. .. | 13·5 | — | 13·5 |
| බටහිර ජර්මනිය .. .. .. .. .. | 11·5 | — | 11·5 |
| යුගෝස්ලාවියාව .. .. .. .. .. | 4·3 | — | 4·3 |
| | 68·7 | 6·3 | 62·4 |
| **දීමනා:** | | | |
| කොළඹ ක්‍රමය : | | | |
| (1) ඕස්ට්‍රේලියාව .. .. .. | 2·5 | | |
| (2) කැනඩාව .. .. .. .. | 5·7 | | |
| (3) නිව්සීලන්තය .. .. .. | — | | |
| | | 8·2 | |
| චීනය .. .. .. .. .. | | 19·7 | |
| ඇමෙරිකා එක්සත් ජනපදය .. .. .. | | 0·9 | |
| බටහිර ජර්මනිය .. .. .. .. | | 2·3 | |
| | | | 31·1 |
| මුළු ණය සහ දීමනා | | | 93·5 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

දේශීය වෙළෙඳ පොලේ බැංකු නොවන මාර්ගයෙන් 1962/63 ලබාගත් ණය රුපියල් කෝටි 15·35 ක් විය. මෙය 1961/62 සංඛ්‍යා වලට වඩා වැඩිය. එහෙත් 1960/61 සංඛ්‍යාවලට වඩා අඩුය. එම වර්ෂයේදී ලැබුන මුදල රුපියල් කෝටි 16·52 ක් විය. ඉතිරි කිරීම් ආයතන, සේවක අර්ථසාධක අරමුදල, රක්ෂණ අරමුදල් සහ අනෙකුත් සමාගම් මේ මුළු මුදල් වැඩි කිරීමෙහිලා උපකාරී විය. දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය පිළිබඳ විග්‍රහයක් වර්ෂ අතර ඇතිවූ වෙනස්කම් ද සමග, 1962/63 රාජ්‍ය ණය දැක්වෙන කොටස යටතේ දක්වා ඇත.

රජයේ සුරැකුම්පත් වල යොදවා ඇති මුදල් (භාණ්ඩාගාර බිල්පත් සහ බදු සංචිත සහතික ඇතුළුව) ප්‍රධාන ආයෝජක පංති අනුව වර්ග කොට පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

රුපියල් දශ ලක්ෂ

| | 1961/62 | 1962/63 | ශුද්ධ වෙනස |
|---|---|---|---|
| 1. ඉතිරිකිරීම් ආයතන | 12·5 | 14·3 | 1·8 |
| 2. සේවක අර්ථසාධක අරමුදල් | 59·4 | 61·7 | 2·3 |
| 3. අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් | 25·0 | 31·2 | 6·2 |
| 4. රක්ෂණ අරමුදල්* | 10·1 | 22·4 | 12·3 |
| 5. අනෙකුත් සමාගම් | –7·4 | 5·0 | 12·4 |
| 6. සමාජ හා ආයතන | –1·4 | 0·1 | 1·5 |
| 7. පුද්ගලයන් | 1·7 | 0·1 | –1·6 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

*රක්ෂණ සංස්ථාවේ දයක දීමනා ද ඇතුළුව.

**රාජ්‍ය ණය**

දේශීය හා විදේශීය, රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා තොරතුරු දෙවැනි පරිශිෂ්ටයේ 23 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. පසුගිය මුදල් වර්ෂ පහේ එක් වර්ෂයේ අවසානයට තුබූ රාජ්‍ය ණය ප්‍රමාණයන් පහත දැක්වේ.

සංඛ්‍යා සටහන II උ—7

**මුළු රාජ්‍ය ණය(1)**

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයේදී | දළ ණය | ශුද්ධ (නිදන් අරමුදල් වටිනාකම් අඩුකොට) |
|---|---|---|
| 1959 | 1,837·0 | 1,524·7 |
| 1960 | 2,230·4 | 1,912·8 |
| 1961 | 2,651·0 | 2,332·7 |
| 1962 | 3,037·8 | 2,686·1 |
| 1963 | 3,437·3 | 3,065·4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහා බැංකුවෙනි.

1962/63 වර්ෂයේ දී දළ ණය රුපියල් කෝටි 39·95 කින් ද, ශුද්ධ ණය 37·93 කින් ද වැඩි විය. පසුගිය අවුරුද්දේ මේ ණය පිළිවෙළින් රුපියල් කෝටි 38·68 කින් හා රුපියල් කෝටි 35·34 කින් වැඩි වී ඇත. රුපියල් කෝටි 39·95 කින් වැඩි වූ දළ ණය, රුපියල් කෝටි 16·83කින් වැඩි වූ රුපියල් කෝටි සුරැකුම්පත්වලින් ද, රුපියල් කෝටි 12·5 කින් වැඩි වූ භාණ්ඩාගාර බිල්පත් වලින් ද, රුපියල් කෝටි 0·63 කින් වැඩි වූ බදු සංචිත සහතික වලින් ද, රුපියල් කෝටි 6.3 කින් වැඩි වූ විදේශීය ණය වලින් ද සමන්විත විය. 1961/62 වර්ෂයේ දී රුපියල් කෝටි 2.09 ක් ගෙවනු ලැබුවද, මේ වර්ෂයේ මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 3.69කින් වැඩි විය.

(1) මේ රාජ්‍ය ණය සංඛ්‍යාවලට, 1963 සැප්තැම්බර් මාසය අවසානයට දී තුබූ රුපියල් කෝටි 7·5 ක ජාතික නිවාස ණයකර සහ රුපියල් කෝටි 4·33 ක රජයේ උකස් බැංකු ණයකර ද ඇතුළත් නොවේ.

## දේශීය ණය

1962/63 මුදල් වර්ෂය අවසානයට දළ දේශීය ණය, රුපියල් කෝටි 303·02 ක් ව තිබිණි. මෙ දිනට මේ ණය සැකැසී තුබුනේ මෙසේය :—රුපියල් ණය රුපියල් කෝටි 168·36 භාණ්ඩාගාර බිල් රුපියල් කෝටි 112·5, බදු සංචිත සහතික රුපියල් කෝටි 1·91, මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 20·25යි. දේශීය ණය සම්බන්ධයෙන් ඇති වූ වෙනස්කම් 1961-62 වර්ෂය හා සසඳා පහත එන සංඛ්‍යා සටහනේ බෙදු දක්වා ඇත.

### දේශීය රාජ්‍ය ණය සැකැසුම

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයට | රුපියල් ණය | | | භාණ්ඩාගාර බිල් | බදු සංචිත සහතික | මහ බැංකු අත්තිකාරම් (3) | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | දළ | නිදන් අරමුදල් (2) | ශුධ | | | | දළ | ශුධ |
| 1962 .. .. .. | 1,515·3 | 263·9 | 1,251·5 | 1,000·0 | 12·8 | 165·6 | 2,693·7 | 2,429·9 |
| 1963 .. .. .. | 1,683·6 | 276·3 | 1,407·3 | 1,125·0 | 19·1 | 202·5 | 3,030·2 | 2,753·9 |
| වෙනස (1) .. .. | +168·3 | +12·4 | +155·8 | +125·0 | +6·3 | +36·9 | +336·5 | +324·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) + ලකුණ වැඩිවීමක් දක්වෙයි.
(2) නිදන් අරමුදල වෙනුවෙන් ඇති ආයෝජන වල වෙළෙඳ වටිනාකම පිළිබිඹු වෙයි. (අනුපූරික නිදන් අරමුදල් ඇතුළුව)
(3) රුපියල් කෝටි 3·95 ක් වන විශේෂ ණය ද ඇතුළත් වෙයි.

## රුපියල් සුරැකුම්පත්

පසු ගිය මුදල් වර්ෂ පහ තුළ ගන්නා ලද ණය සහ ගෙවන ලද ණය පහත සටහනේ දක්වේ :—

### සංඛ්‍යා සටහන II උ—8

රුපියල්

| මුදල් වර්ෂය | ගන්නා ලද ණය | ගෙවන ලද ණය |
|---|---|---|
| 1958/59 .. .. .. | 12,04,16,800 | 3,50,25,200 |
| 1959/60 .. .. .. | 19,50,00,000 | 5,52,39,200 |
| 1960/61 .. .. .. | 26,95,83,200 | 8,97,48,800 |
| 1961/62 .. .. .. | 19,36,99,600 | 7,50,00,000 |
| 1962/63 .. .. .. | 22,13,25,700 | 5,30,81,000 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1962/63 මුදල් වර්ෂයේ රුපියල් කෝටි 22·13 ක් වූ රුපියල් ණය වලින් රුපියල් කෝටි 1·63 ක් සඳහා වූ ණය දෙකක් ම මුලින් නිකුත් කළ සුරැකුම් හරවා දීම සඳහාවූ අතර, රුපියල් කෝටි 20.50 ක් සඳහා වූ ඉතිරි ණය දහයම, මුදල් පමණක් ලබා ගැනීම සඳහා විය. රුපියල් කෝටි 1.63 ක් සඳහා වූ 1968/70 සියයට $3\frac{1}{2}$ හැරවුම් ණයත්, 1984/88 සියයට $4\frac{1}{4}$ හැරවුම් ණයත්, රුපියල් කෝටි 1.63ක්වූ 1961/63 සියයට $2\frac{1}{2}$ ණය නැවත හරවා ගැනීම සඳහා නිකුත් කැරුනේය. 1963 පෙබරවාරි යේ කල්පිරෙන ණයේ රුපියල් කෝටි 1.08 ක් සඳහා වූ ණයපත් 1968/70 සියයට $3\frac{1}{2}$ ණයපත් සඳහා ගෙවීමට භාර දෙන ලදී. ඉතිරි රුපියල් කෝටි 0.55 මුදල් වලින් ගෙවනු ලැබූ අතර, රුපියල් කෝටි 0.52, 1968/70 සියයට $3\frac{1}{2}$ හැරවුම් ණයටත්, රුපියල් කෝටි 0.03 ක් 1984/88 සියයට $4\frac{1}{4}$ හැරවුම් ණයටත් යොදු ගනු ලැබීය. ලබා ගන්නා ලද ඉතිරි ණය දහයෙන් අටක් සම්පූර්ණයෙන්ම මුදල් සඳහා විය. මෙයට, 1962 ඔක්තෝබර්/නොවැම්බරයේ නිකුත් කරන ලද 1967/69 සියයට $3\frac{1}{2}$ ණයත්, 1983/87 'එෆ්' කාණ්ඩයේ සියයට $4\frac{1}{4}$ ණයත්, 1962 දෙසැම්බරයේ දී නිකුත් කරන ලද 1983/87 'එච්' කාණ්ඩයේ සියයට $4\frac{1}{4}$ ණයත්, 1963 පෙබරවාරි යේදී නිකුත් කරන ලද 1983/87 'එච්' කාණ්ඩයේ සියයට $4\frac{1}{4}$ ණයත්, 1963 මාර්තු වල නිකුත් කරන ලද 1984/88 'සී' කාණ්ඩයේ සියයට $4\frac{1}{4}$ ණයත්, 1963 ජූනි වල නිකුත් කරන ලද 1984/88 සියයට $4\frac{1}{4}$ ණයත්, 1963 ජූලි වල නිකුත් කරන ලද 1984/88 'බී' කාණ්ඩයේ සියයට $4\frac{1}{4}$ ණයත්, 1963 සැප්තැම්බර් මාසයේ නිකුත් කරන ලද 1984/88 'සී' කාණ්ඩයේ සියයට $4\frac{1}{4}$ ණයත් ඇතුළත් වෙයි.

සංඛ්‍යා සටහන II උ—9

## 1962-63 රජයේ සුරැකුම්පත් බෙදීගිය අයුරු

රුපියල් දශ ලක්ෂ

| | 1967–69 සියයට 3½ ණය | 1983–87 'එප්' කාණ්ඩයේ සියයට 4½ ණය | 1983–87 'ජී' කාණ්ඩයේ සියයට 4¼ ණය | 1967–69 'බී' කාණ්ඩයේ සියයට 3½ ණය | [1] 1983–87 'එච්' කාණ්ඩයේ සියයට 4¼ ණය | 1968-70 සියයට 3½ ණය | | 1984-88 සියයට 4¼ ණය | | 1984–88 'බී' කාණ්ඩයේ සියයට 4¼ ණය | 1984–88 'සී' කාණ්ඩයේ සියයට 4¼ ණය | 1984–88 සියයට 4¼ ණය | 1984–88 'බී' කාණ්ඩයේ සියයට 4½ ණය | 1984–88 'සී' කාණ්ඩයේ සියයට 4½ ණය | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | හැරවීම | මුදල් | හැරවීම | මුදල් | | | | | | ප්‍රමාණය | සියයට ගණන |
| වෙළෙඳ බැංකු .. .. .. | 5·0 | — | 0·3 | 6·8 | — | 10·7 | 2·6 | — | ... | — | — | — | — | — | 25·4 | 11·5 |
| සමුපකාර බැංකු .. .. .. | — | — | — | — | 0·3 | — | — | — | — | — | — | — | — | — | 0·3 | 0·1 |
| ඉතිරි කිරීමේ ආයතන .. .. .. | — | 2·0 | 3·0 | — | 0·5 | — | — | — | — | 2·0 | 1·0 | 3·8 | 2·0 | 3·0 | 17·3 | 7·8 |
| නිදන් අරමුදල් .. .. .. | — | 0·4 | — | — | 6·2 | — | — | — | — | 8·3 | 4·8 | 2·0 | 12·2 | 2·5 | 36·4 | 16·4 |
| දෙපාර්තමේන්තු හා අනිකුත් කාර්යාලයීය අරමුදල් .. .. .. .. | — | 0·6 | 1·8 | 0·1 | 1·2 | — | — | — | — | ... | 2·7 | 0·8 | 0·2 | 0·1 | 7·5 | 3·4 |
| භාරකාර මණ්ඩල, සුබ සාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් | | | | | | | | | | | | | | | | |
| (අ) සේවක අර්ථසාධක අරමුදල .. .. | — | 15·3 | — | — | 9·1 | — | — | — | — | 9·5 | 5·9 | 12·3 | 6·3 | 9·4 | 67·8 | 30·6 |
| (ආ) අනෙකුත් .. .. .. | 0·5 | 5·7 | 1·1 | 5·0 | 2·2 | — | 1·3 | ... | 0·1 | 2·4 | 6·4 | 6·7 | 3·3 | 1·9 | 36·6 | 16·5 |
| රක්ෂණ සංස්ථාව .. .. .. | — | 3·0 | 1·0 | — | — | — | — | — | — | 2·5 | 2·5 | 2·2 | — | 1·7 | 12·9 | 5·8 |
| රක්ෂණ සමාගමේ .. .. .. | 2·3 | — | — | 3·8 | ... | 0·1 | 1·3 | — | 0·1 | 0·2 | 1·1 | 2·1 | 0·9 | 1·5 | 13·4 | 6·1 |
| අනෙකුත් සමාගම් .. .. .. | 0·1 | — | 0·1 | 0·4 | — | — | 0·1 | — | — | 0·1 | — | ... | — | — | 0·8 | 0·4 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන .. .. | 0·1 | 0·1 | 1·1 | 0·5 | 0·5 | — | ... | — | ... | ... | 0·6 | 0·2 | 0·1 | ... | 3·2 | 1·4 |
| එකතුව .. .. .. .. | 7·9 | 27·1 | 8·4 | 16·6 | 20·0 | 10·8 | 5·2 | ... | 0·3 | 25·0 | 25·0 | 30·0 | 25·0 | 20·0 | 221·3 | 100·0 |

සංඛ්‍යා:– ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. රුපියල් කෝටි 0·5 ක් හා රුපියල් කෝටි 0·94 ක්වූ 1957–62දී කල්පිරෙන සියයට 3½ ණය, 1983–87 'ජී' කාණ්ඩයේ සියයට 4¼ ණය හා 1967–69 'ජී' කාණ්ඩයේ සියයට 3¼ ණය ගෙවීම් වස් පවරා දෙන ලදී.
2. 1963 ජනවාරි මාසයේ දී කල්පිරුන, රුපියල් කෝටි 1·63 ක්වූ, 1961–63 සියයට 2½ ණය හැරවීම් වස් නිකුත් කැරුන ණය.

කල්පිරුන 1957/62 සියයට $3\frac{1}{2}$ සුරකුම්පත් වලින් රුපියල් කෝටි 0·5 ක සුරකුම්පත් සහ රුපියල් කෝටි 0·94 ක සුරකුම්පත් 1962 නොවැම්බරයේ නිකුත් කරන ලද 1983-87 'ජී' කාණ්ඩයේ සියයට $4\frac{1}{4}$ ණය මුදලට සහ 1967/69 බී කාණ්ඩයේ සියයට $3\frac{1}{2}$ ණය මුදලට පිළිවෙළින් පවරා දෙන ලදී. මුළු මුදල රුපියල් කෝටි 22·13 ක් සඳහා නිකුත් කළ සුරකුම්පත් සඳහා සම්පූර්ණයෙන් ම මුදල් ලැබිණි. සුරකුම්පත් බෙදී ගිය අයුරු වර්ග කොට II උ—9 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**ආයෝජකයෝ:**—රජයේ සුරකුම්පත් බෙදී ගිය අයුරු වර්ග කොට දක්වන 95 වැනි පිටේ ඇති II උ—9 සංඛ්‍යා සටහනට අනුව ලබා ගත් මුළු ණය ප්‍රමාණයෙන්, රුපියල් කෝටි 6.78 ක් හෙවත් සියයට 30.6 ක් සේවක අර්ථසාධක අරමුදලෙන් ලැබී ඇති බව හෙළි වෙයි. 1961/62 දී මෙ මාර්ගයෙන් ලැබී ඇති ප්‍රමාණය රුපියල් කෝටි 5.40 ක් හෙවත් සියයට 27.9 කි. 1962/63 ඉතිරි රුපියල් කෝටි 15.3 සඳහා වූ ණය බෙදී ගියේ මෙසේය. වර්ග කිරීමෙහි ''අනෙකුත්'' යනුවෙන් වර්ග කොට ඇති අය සහ භාරකාර මණ්ඩල, අර්ථ සාධක හා විශ්‍රාම වැටුප් අරමුදලට සියයට 16.5 ක් ද, නිදන් අරමුදලට සියයට 16.4 ක් ද, බෙදී ගිය අතර, රජය සතු රක්ෂණ සමාගම් ඇතුළුව රක්ෂණ සමාගම් වලට සියයට 11.9 ක් බෙදී ගියේය. වෙළෙඳ බැංකු වලට සියයට 11.5 ක් ද, ඉතිරි කිරීම් ආයතන වලට සියයට 7.8 ක් ද බෙදී ගියේය. රජයේ සුරකුම් පත් සඳහා බැංකු නොවන ආයෝජකයන් අතර පැවැති අඩු ඉල්ලුම පිළිසර වීමට හේතුවක් ලෙස 1962 වාර්ෂික වාර්තාවේ දක්වූවද, 1962/63 අත් දැකීම් බොහෝ සෙයින් ම දිරි ගන්වන සුළුය. බැංකු නොවන ආයෝජකයන් විසින් රජයේ සුරකුම්පත් මෙසේ වැඩියෙන් ගනු ලැබුව ද, වෙළෙඳ බැංකු වෙනැති පුද්ගලයන් සතු කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු ද රුපියල් කෝටි 6.48 කින් වැඩිවීම මෙහි දී විශේෂ වෙයි. 1961/62 දී මෙ තැන්පතු වැඩි වී ඇත්තේ රුපියල් කෝටි 4.26 කිනි.

1961-62 සහ 1962-63 රජයේ සුරකුම්පත් බෙදී ගිය අයුරු වර්ග කොට සසඳා පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

## 1961/62 සහ 1962/63 රජයේ සුරකුම්පත් බෙදී ගිය අයුරු වර්ගකොට සැසැඳීම

රුපියල් දශ ලක්ෂ

| | 1961/62 | | 1962/63 | | වෙනස |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය |
| වෙළෙඳ බැංකු .. .. .. .. | 63·2 | 32·6 | 25·4 | 11·5 | –37·8 |
| සමුපකාර ප්‍රාදේශීය බැංකු .. .. .. | 0·6 | 0·3 | 0·3 | 0·1 | – 0·3 |
| ඉතිරි කිරීමේ ආයතන .. .. .. | 14·0 | 7·2 | 17·3 | 7·8 | + 3·3 |
| නිදන් අරමුදල් .. .. .. .. | 16·4 | 8·5 | 36·4 | 16·4 | +20·0 |
| දෙපාර්තමේන්තු සහ අනෙකුත් කාර්යාලයීය අරමුදල්.. | 6·0 | 3·1 | 7·5 | 3·4 | + 1·5 |
| භාරකාර මණ්ඩල, අර්ථ සාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල .. .. .. .. | | | | | |
| 1. සේවක අර්ථසාධක අරමුදල .. .. | 54·0 | 27·9 | 67·8 | 30·6 | +13·8 |
| 2. අනෙකුත් .. .. .. .. | 26·7 | 13·8 | 36·6 | 16·5 | + 9·9 |
| රක්ෂණ සමාගම් .. .. .. .. | 10·3 | 5·3 | 26·3* | 11·9 | +16·0 |
| අනෙකුත් සමාගම් .. .. .. .. | 0·2 | 0·1 | 0·8 | 0·4 | + 0·6 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන .. .. .. | 2·7 | 1·4 | 3·2 | 1·4 | + 0·5 |
| එකතුව .. .. .. .. | 193·7 | 100·0 | 221·3 | 100·0 | +27·6 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහා බැංකුවෙනි,

* රක්ෂණ සමායතනයෙන් දයකවන ලද රුපියල් කෝටි 1.29 ක මුදලක්ද ඇතුළත් වෙයි. (එකතුවෙන් සියයට 5·8 කි).

\+ ලකුණෙන් වැඩිවීමක් දක්වෙයි.

\- ලකුණෙන් අඩුවීමක් දක්වෙයි.

### කල්පිරීම සහ පොළී අනුපාතිකය අනුව වර්ග කිරීම

කල්පිරීම අනුව වර්ග කිරීමේ දී, මුළු එකතුව, රුපියල් කෝටි 18·1 ක් වන අවුරුදු 21-25 ට කල්පිරීමට නියමිත ණය නවයක් ගෙන ඇත. මෙහි මුල් ණය හයට, සියයට $4\frac{1}{4}$ ක වාර්ෂික පොළියක් නියමිතය. මීට පසු පොළී අනුපාතිකය සියයට $\frac{1}{4}$ කින් වැඩිකරන ලදී. වැඩි පොළියට නිකුත් කළ ණය තුනෙන් පළමුවැන්න 1963 ජූනි වල නිකුත් කැරිණි. මෙම ණය සියයට $4\frac{1}{4}$ පොළියට සමකාලය තුළ දී කල්පිරීමට නියමිත පසුගිය අවුරුද්දේ ගනු ලැබූ ණය හා සැසැඳීම වටී. රුපියල්කෝටි 4.0 ක් සඳහා වූ ඉතිරි ණය තුන සියයට $3\frac{1}{2}$ වාර්ෂික පොළියකට අවුරුදු 5—7 කාලය තුළ දී කල් පිරෙන සේ ගනු ලැබීය. මේ ණය සඳහා පොළිය 1962 මාර්තු වල දී සියයට $3\frac{1}{4}$ සිට සියයට $3\frac{1}{2}$ තෙක් වැඩිකරනු ලැබීය.

**භාණ්ඩාගාර බිල්පත්**

1962-63 දී වැඩි වූ දළ දේශීය රාජ්‍ය ණය වලින් වැඩි කොටසක් මෑත වර්ෂ වල දී මෙන් වැඩි වූ භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත නොවීය. දළ රාජ්‍ය ණය සැකැසුමෙහි, ප්‍රධාන ශීර්ෂය වශයෙන් භාණ්ඩාගාර බිල්පත් වලට තුබුන තැන රුපියල් සුරකුම්පත්වලට හිමි විය. 1962-10-1 වැනි දින මුදල් වර්ෂය අරඹන විට, නිකුත් කොට නොබේරා තුබුන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 100 ක් විය. භාණ්ඩාගාර බිල්පත් සඳහා බලය ලත් සීමාවත් රුපියල් කෝටි 100 ක් විය. 1963-3-21 වැනි දින පාර්ලිමේන්තු සම්මුතියකින් බලයලත් සීමාව තවත් රුපියල් කෝටි 15 කින් වැඩි කළේ එය රුපියල් කෝටි 115 සීමාවට ගෙනෙන ලදී. මුදල් වර්ෂයේ දී අවසාන දිනය වන 1963-9-30 වැනි දිනට නිකුත් කොට නොබේරා තුබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 112.5 ක් විය. මේ අනුව මුදල් වර්ෂය තුළ රුපියල් කෝටි 12.5 ක වැඩි වීමෙක් දක්වෙයි. මේ අනුව, මුදල් වර්ෂය අවසාන වන විට, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට හැකි සීමාවෙන් ප්‍රයෝජනයට නොගෙන රුපියල් කෝටි 2.50 ක් විය.

1963 සැප්තැම්බර් අවසානයට මහ බැංකුව සතුව තුබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 98·89 ක් විය. 1962-9-30 වැනි දිනට මහ බැංකුව සතුව තුබූ ප්‍රමාණය රුපියල් කෝටි 86·44 ක් වූ අතර, 1961 සැප්තැම්බර් අවසානයට රුපියල් කෝටි 68 ක් විය.

**විදේශීය ණය**

දළ විදේශීය ණය රුපියල් කෝටි 6·30* කින් වැඩි වූ අයුරු විග්‍රහ කොට පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II උ—10

**විදේශීය ණය**

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 ශුද්ධ වැඩිවීම | 1963 සැප්තැම්බර් 30 වැනි දිනට නොගෙවා තුබූ ශේෂය. |
|---|---|---|
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරන හා සංවර්ධන බැංකුව .. .. .. | 21·2 | 123·3 |
| කැනේඩියානු ණය .. .. .. .. .. .. | 0·7 | 9·1 |
| චීන ණය .. .. .. .. .. .. | — | 9·2 |
| එක්සත් රාජධානියේ ණය මාලාව .. .. .. .. | 11·9 | 15·3 |
| එක්සත් රාජධානියේ පවුම් සුරකුම්පත්. .. .. .. | — | 167·9(1) |
| ඇමරිකා එක්සත් ජනපදයේ සංවර්ධන ණය අරමුදලේ ණය. . .. | – 0·7 | 12·6 |
| ඇමරිකා එක්සත් ජනපදයේ (අයි.සී.ඒ.) ණය .. .. .. | ... | 31·6 |
| සෝ.ස.ස. සංගමයේ ණය .. .. .. .. .. | 14·1 | 22·3 |
| බටහිර ජර්මන් ණය .. .. .. .. .. | 11·5 | 11·5 |
| යුගෝස්ලෝවියානු ණය .. .. .. .. .. | 4·3 | 4·3 |
| එකතුව .. .. .. .. .. .. | 63·0 | 407·1(2) |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. මේ වගකීමට එරෙහිව, පවුම් සුරකුම්පත්. බේරීම සඳහා පවත්වාගෙන යන නිදන් අරමුදලේ වටිනාකම රුපියල් කෝටි 9.56 ක් වෙයි. මේ අනුව, ඇති ශුද්ධ වගකීම රුපියල් කෝටි 7.23 කි.
2. එක්සත් රාජ්‍යයේ පවුම් සුරකුම්පත් සඳහා ඇති නිදන් අරමුදල සමග ගැලපූ විට, මුළු ශුද්ධ වගකීම රුපියල් කෝටි 31.15 කි.

* සෝ.ස.ස සංගමයෙන් ලැබුනු රු. කෝටි .05 ක ණය ඇතුළත් වෙයි. පොත් වැහීමෙන් පසුව මෙය රැගත් නිසා 1961/62 ගිණුම්වලට නොවැටිණි.

**නිදන් අරමුදල්:—**රාජ්‍ය ණය බේරීම සඳහා ඇති නිදන් අරමුදලේ වටිනාකම 1962/63 මුදල් වර්ෂය අවසාන වන විට, රුපියල් කෝටි 37·19 ක්ව තිබිණි. 1961/62 මුදල් වර්ෂය අවසාන වන විට තුබුන සංඛ්‍යා හා සසඳන විට මෙය රුපියල් කෝටි 2·01 කින් වැඩිය. ණය ගෙවීම සඳහා රුපියල් කෝටි 3·67 ක් මෙයින් ලබා ගන්නා ලදී. නිදන් අරමුදල සඳහා අය-වැය ලේඛනයෙන් වෙන් කළ මුදල රුපියල් කෝටි 4·04 ක් වූ අතර, එහි ආයෝජන වලින් ලැබුන පොළිය, රුපියල් කෝටි 1·33 ක් විය. නිදන් අරමුදල සතු වත්කම් වල වෙළෙඳ වටිනාකම රුපියල් කෝටි 0·31 ක වැඩි වීමෙක් පෙන් විය.

**අර්ධ රාජ්‍ය ආයතන විසින් ගත් ණය**

1962/63 දී රුපියල් කෝටි ·5 ක් සඳහා ජාතික නිවාස ණයකර නිකුත් කරන ලදී. එසේ ම වසර තුළ දී රජය විසින් ජාතික නිවාස කොමසාරිස් තැනට රුපියල් කෝටි 1·5 ක ණයක් දෙන ලදී. මේ සමග මෙසේ ජාතික නිවාස කොමසාරිස් තැනට කෙළින් ම දෙන ලද මුළු ණය රුපියල් කෝටි 5·5 ක් විය. නිකුත් කොට නොබේරා ඇති ජාතික නිවාස ණයකර, රුපියල් කෝටි 7·50 තෙක් වැඩි විය. ජාතික නිවාස ණයකර බේරීම සඳහා පිහිටුවා ඇති නිදන් අරමුදලේ නියම වෙළෙඳ වටිනාකම මුදල් වර්ෂයේ අවසානය වන විට රුපියල් කෝටි 1·9 ක් විය.

1962/63 වර්ෂයේ දී රජයේ උකස් බැංකු ණයකර නිකුත් කොට ණය ගනු නොලැබීය. උකස් බැංකුවේ කටයුතු සඳහා අයිරාවන් පිට වෙළෙඳ බැංකු වලින් ණය ගනු ලැබීය. රජයේ උකස් බැංකු පනතේ 35 වැනි වගන්තිය යටතේ, උකස් බැංකුවට ණය වීමට හැකි සීමාව, 1962-63 මුදල් වර්ෂයේ දී රුපියල් කෝටි 6·5 ක් ව පැවැතිණි. රුපියල් කෝටි 0·25 ක් සඳහා වූ සියයට 2½, 1961-63 රජයේ උකස් බැංකු ණයකරයක් 1963-2-1 වැනි දින ගෙවනු ලැබීය. නිකුත් කොට නොගෙවා ඇති ණයකර, 1963 සැප්තැම්බර් 30 වැනි දිනට, රුපියල් කෝටි 4·33 ක් ව තුබුන අතර, ඇප පිට මෙතෙක් නොගෙවා ඇති අයිරාවන්ගේ වටිනාකම, මුදල් වර්ෂය අවසානය වන විට රුපියල් කෝටි 1·10 ක් විය.

**1963/64 අය-වැය ලේඛනය**

1963-64 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත කැරුන ආදයම් හා වියදම් පිළිබඳ මුල් ඇස්තමේන්තු පහත දැක්වේ.

සංඛ්‍යා සටහන II උ—11

**මුල් අය වැය ඇස්තමේන්තු**

රුපියල් දශ ලක්ෂ

| | | |
|---|---|---|
| (අ) ආවර්තන වියදම් (වැය ශීර්ෂ 1, 2, 4 සහ 6) .. .. .. .. | 1,790·4 | |
| සියයට 2½ ඌන වියදම් .. .. .. .. .. | 44·7 | 1745·7 |
| (ආ) ප්‍රාග්ධන වියදම් (වැය ශීර්ෂ 3, 5 සහ 7) .. .. .. .. .. .. | | 516·4 |
| (ඇ) මුළු වියදම (අ + ආ) .. .. .. .. .. .. .. | | 2262·1 |
| (ඈ) ආදයම (අළුත් බදු අය ද ඇතුළුව) .. .. .. .. .. | | 1787·6 |
| (ඉ) අයවැය හිඟය (ඇ—ඈ) .. .. .. .. .. .. | | 474·5 |
| (ඊ) නිදන් අරමුදල් දීමනා සහ අවක්‍ර රාජ්‍ය ණය බේරීම් හැර .. .. .. | | 56·4 |
| (උ) ඇස්තමේන්තු කළ ශුද්ධ අය-වැය හිඟය (ඉ—ඊ) .. .. .. .. .. | | 418·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

රුපියල් කෝටි 47·45 ක් ව පැවැති අය-වැය හිඟය පියවීමේ මාර්ග පහත දැක්වේ.

| | |
|---|---|
| වෙළෙඳ පොළෙන් ගනු ලබන ණය රුපියල් කෝටි ... | 22·0 |
| විදේශාධාර ... ... ... ... ... | 17·5 |

රජයේ නියෝජ්‍යත්ව වලින් පරිපාලන වශයෙන් ගනුලබන රුපියල් කෝටි 2.5 ක ණය සමග මෙහි එකතුව රුපියල් කෝටි 42.0 ක් විය. ඉතිරි රුපියල් කෝටි 5.45 න් කොටසක් රජයේ සුරැකුම්පත් මගින් වෙළෙඳ බැංකු වලින් ද, අනෙක් කොටස භාණ්ඩාගාර බිල්පත් මගින් ද ලබා ගැනීමට බලාපොරොත්තු විය.[1]

**ආදායම**

1963–64 වර්ෂය සඳහා ඇස්තමේන්තු කොට ඇති ආදායම රුපියල් කෝටි 178·76ක් වෙයි. මෙයට අළුත් බදු වලින් ලැබෙන රුපියල් කෝටි 8·8ක් ද ඇතුළත් වෙයි. මෙය 1962–63 මුදල් වර්ෂය සඳහා තත්‍ය වශයෙන් ලැබී ඇති ආදායම වන රුපියල් කෝටි 159·34 හා සසඳන විට ජංගම මුදල් වර්ෂය සඳහා රුපියල් කෝටි 19·42ක වැඩිවීමක් දක්වෙයි. අය-වැය ලේඛනයෙන් යෝජිත අළුත් ආදායම් මාර්ග සහ ඒ ක්‍රියාත්මක කිරීමෙන් මුදල් වර්ෂය තුළ ලැබිය හැකි අමතර ආදායම පහත දක්වා ඇත.

| | | රුපියල් දශලක්ෂ |
|---|---|---|
| 1. | පිරිවැටුම් බද්ද ... ... ... | 40[2] |
| 2. | විදේශීය විනිමය බද්ද ... ... ... | 10 |
| 3. | වැඩි කළ ආනයන බදු ... ... ... | 40 |
| 4. | ජාතික ලොතරැයිය ... ... ... | 15 |
| 5. | මුද්දර ගාස්තු ... ... ... | 4 |
| 6. | මුදල් හා ත්‍යාග බදු ... ... ... | 2 |
| 7. | පැට්‍රල් ... ... ... | 2 |
| 8. | ගල්ඔය සහ කන්තලේ මද්‍යසාර ... ... | 6 |
| | එකතුව (1 සිට 8) | 119 |

එහෙත් රජය මෙයින් බලාපොරොත්තුවූ ශුද්ධ ආදායම රුපියල් කෝටි 8·8ක් විය. ජීවන වියදම් අඩුකරලීමට සැකැසි ඇති සමහර යෝජනා ක්‍රියාත්මක වූ පසු රුපියල් කෝටි 3.1ක පාඩුවක් වෙතැයි බලාපොරොත්තු විය. මේ යෝජනා සහ මුදල් ප්‍රමාණයන් පහත දක්වේ.

| | | රුපියල් දශලක්ෂ |
|---|---|---|
| 1. | පිටි මිල අඩුකිරීම ... ... ... | 20 |
| 2. | රෙදි ආනයන බදු අඩුකිරීම ... ... | 6 |
| 3. | මෝටර් රථ අමතර කොටස් ආනයන බදු අඩු කිරීම ... | 3 |
| 4. | භූමිතෙල් මිල අඩු කිරීම ... ... ... | 2 |
| | එකතුව (1 සිට 4) | 31 |

**නව බදු යෝජනා**

ආදායම් බද්ද:– අඩු ආදායම් ලබන අයගේ බදු බර අඩු කිරීමේ අටියෙන් දේශීය ආදායම් බදු පනතෙහි සැලකිය යුතු වෙනස්කම් කිපයක් 1963–64 අය–වැය ලේඛනයෙන් යෝජනා කැරිණි. මෙයින් ඉපැයූ ආදායම් ලබන අයට සහ ස්වයං සේවයේ යෙදී ඇති අයට විශේෂයක් කැරුන අතර, ඉහල ආදායම් පංති වල යැපෙන්නන්ගේ බදු සහන අඩු කැරුණි. බදු අවශ්‍යතා සඳහා ආදායම ගණන් බැලීමේ දී කැරුන වඩාත් වැදගත් වෙනස්කම් මෙසේ ය :—

1. 1963 අගෝස්තු 1 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අය-වැය ලේඛනයට අනුව අය–වැය ලේඛන පූර්ව බදු අනුව, රුපියල් කෝටි 55·8ක අය-වැය හිඟයක් බලාපොරොත්තු විය. අළුත් බදු වලින් ලැබෙන රුපියල් කෝටි 8·8 අඩු කළ විට අය-වැය හිඟය රුපියල් කෝටි 47·0 කි. එහෙත් පාර්ලිමේන්තුවෙන් රුපියල් කෝටි 47·45 ක හිඟයක් සම්මත විය. වැඩි වූ කෝටි 0·45 වැඩි වන වියදම් සඳහාය.

2. පිරිවැටුම් බද්දෙන් රුපියල් කෝටි 4·0 ක් ලැබෙනැයි ඇස්තමේන්තු කැරිණි. එහෙත් පාර්ලිමේන්තුවෙන් සම්මතවූ ඇස්තමේන්තුවෙන් රුපියල් කෝටි 4·5 ක් ලැබෙතියි බලාපොරොත්තු විය.

(අ) ආදායම් බදු සැලැස්මෙහි භාග ක්‍රමය නැති කොට පවුලේ ආදායම් තත්ත්වය අනුව මුල් බදු ශ්‍රෙණිය අඩු-වැඩි වන අයුරු ආදායම ගුණනය කිරීම ඇරඹීම, මේ මුල් බදු ශ්‍රෙණිය රුපියල් 4,000 සිට රුපියල් 13,000 දක්වා වෙනස් වන අතර, ඒ සඳහා සියයට 15ක බද්දක් නියමිතය. බදු අය විය යුතු ඊළඟ බදු ශ්‍රෙණීන්, පවුලේ ආදායමේ තත්ත්වය ගැන නොසලකා බදු ගෙවන හැමට එක හා සමාන වෙයි. යෝජිත බදු ශ්‍රෙණි අනුව තනි පුද්ගලයෙකුගේ මුල් බදු ශ්‍රෙණිය රු. 4,000 ක් වෙයි. පුරුෂයාට සහ භාර්යාවට රු. 7.000ක් වෙයි. ළමයකුට හෝ යැපෙන්නකුට අමතර රු. 1,500ක් දෙන අතර, එසේ දෙනු ලබන වැඩිම ලමයින් හෝ යැපෙන්නන් ගණන 4 දෙනෙකි. මේ අනුව ලමයි සිව් දෙනෙක් සහිත.දෙමාපියකුට ලැබෙන මුල් බදු ශ්‍රෙණිය රුපියල් 13,000ක් වෙයි. මෙහි ප්‍රතිඵලය වනුයේ, රුපියල් 3,000 සිට 6,000 දක්වා ආදායම් ලබන රු. 25,000 සිට 28,000 පමණ වූ බදු ගෙවන්නන් සම්පූර්ණයෙන් ම බදු වලින් නිදහස් වීමයි. රුපියල් 6,000 සිට 15,000 දක්වා වාර්ෂික ආදායමක් ලබන අය මෙසේ ආදායම් බදු වලින් නිදහස් කිරීමට බලාපොරොත්තු වන අතර, රු. 15,000 සිට 20,000 දක්වා ආදායම් ලබන අය ගෙවන බදු ප්‍රමාණය පෙර පරිදිම වෙයි. එහෙත්, යැපෙන්නන් ට දෙන සහනය අඩු කිරීම නිසා රු. 20,000 වැඩි ආදායම් ලබන අයගේ බදු බර වැඩි වෙයි.

(ආ) ඉපැයූ ආදායම් වෙනුවෙන් රු. 500 ක බදු නිදහස් මුදලක් දීම.

(ඇ) ''යැපෙන්නන්'' යන්නෙහි අර්ථ නිරූපනය වෙනස් කොට අධ්‍යාපන ආයතනයක නඩත්තු කරන සහෝදරයන් සහ අවිවාහක සහෝදරියන් ඇතුළත් වනසේ පුළුල් කිරීම.

(ඈ) සේවාවේ නියුතු අවිවාහක දරුවකුගේ ආදායම දෙමාපියන්ගේ ආදායමට එකතු නොකිරීම. භාර්යාවගේ රැකියාවෙන් ලැබෙන ආදායම එකතු කළ හැකි වුවද, ඒ සඳහා ලැබෙන දීමනා එකී ආදායමෙන් අඩු කළ හැකිය.

(ඉ) පවුලේ වගකීම සහ තත්ත්වය අනුව නොසලකා අවම වශයෙන් අයකැරුන සියයට 3 නේ හෝ 4 බද්ද නැති කිරීම.

(ඊ) ආදායම් බදු සම්බන්ධයෙන් කැරුන අනෙකුත් වෙනස්කම් වලට රජයේ සුරකුම්පත් වල කැරෙන ආයෝජන සම්බන්ධයෙන්, තුබූ බදු සහනය නැති කිරීම: විශාල වශ යෙන් කැරෙන කෘෂිකර්මය, කිරිපට්ටි සහ සතුන් ඇති කිරීම සඳහා බදු සහන දීම, කාර්මික හා ඉන්ජිනේරු සමාගම් වල පුහුණු වන ආධුනිකයන් සම්බන්ධයෙන් බදු සහන දීම, ව්‍යාපාර ආයතනයක සේවකයකුගේ වැටුප් වශයෙන් වසරකට අඩු කළ හැකි මුදල රු. 36,000 කට සීමා කිරීම.

**අනෙකුත් වැදගත් ආදායම් මාර්ග**

පිරිවැටුම් බද්ද:—බදු සැලැස්මට අළුතෙන් බදු දෙකක් ඇතුළත් කැරිණි.[1] එකී බදු නිෂ්පාදක පිරිවැටුම් බද්ද හා ව්‍යාපාරික පිරිවැටුම් බද්ද යනුවෙන් හැඳින්වෙයි. නිෂ්පාදක පිරිවැටුම් බද්ද යටතේ මෙරට නිෂ්පාදනය කැරෙන පාරිභෝගික භාණ්ඩ බොහොමයක් සඳහා සියයට 3ක බද්දක් අය කැරේ. ව්‍යාපාරික බද්ද යටතේ, මුළු පිරිවැටුපෙන්, සියයට එකකින් බාගයක් අය කැරේ. මේ බද්දට සේවාවන් සපයන ව්‍යාපාර ඇතුළු සියලුම ව්‍යාපාර යටත් වෙයි. පහත සඳහන් ව්‍යාපාර මේ බද්දෙන් නිදහස් වෙයි. ප්‍රථමයෙන් සහල් පිටි, සීනි පාන් අපනයන නිෂ්පාදිත තැබෑරුම් වල අරක්කු සහ රා පැට්‍රල් සිගරට්, භූමිතෙල්, ඩීසල් සහ අනෙකුත් ඉන්ධන සහ ලිහිස්සි තෙල් ද එසේ ම පොත්, වාරික සහ සඟරා ද බද්දෙන් නිදහස් ය. දෙ වැනිව, බැංකු රක්ෂණ සමාගම්, කුලී පිට ගැනුම් කරන සමාගම් උකස් ගන්නන්, මුදල් ණයට දෙන්නන්, කොමිස් ඒජන්තවරු වැනි සියලුම මූල්‍ය ආයතනද, තෙ වැනිව, අධ්‍යාපනික වියදම් හා වෘත්තීය ව්‍යාපාර වල සේවා ද, අවසාන වශයෙන් වාර්ෂක පිරිවැටුම රුපියල් 1,00,000 කට අඩු සියලුම ව්‍යාපාර ද බදු වලින් නිදහස් කරන ලදි.

1. මේ බදු 1964 ජනවාරි 1 වැනි දින ක්‍රියාත්මක විය. අයවැය ලේඛනයෙන් යෝජිත බදු අනුපාතිකයන්, නිෂ්පාදනක පිරිවැටුම සියයට 1·10 ව්‍යාපාරික පිරිවැටුම සියයට එකකින් බාගයයි. කමිටු අවස්ථාවේ දී නිෂ්පාදක පිරිවැටුම් බද්ද සියයට 3 කට අඩු කරන ලදී.

විනිමය බද්ද:—නිවාඩු, සංචාරගමන්, ගාස්තු, කොමිස්, ප්‍රචාරක දැන්වීම් ආදිය සඳහා විදේශීය විනිමය මිලට ගනු ලබන අනුපාතිකය භාණ්ඩ අපනයන සඳහා ගෙවීමට ගන්නා විනිමය අනුපාතිකයට සම කරනු සඳහා අළුත් බද්දක් යෝජනා කරන ලදී. අළුත් බදු අනුපාතිකය මුදල් ගෙවන කරුන අනුව සියයට 10 සිට 25 තෙක් වෙනස් වෙයි.[1] දේපොළ, ලාභාංශ, අධ්‍යාපනය සහ වෛද්‍ය වියදම් සඳහා කැරෙන ගෙවීම් බද්දෙන් නිදහස්ය.

ආනයන තීරු බදු:—සමහර සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී භාණ්ඩ වල තීරු බදු සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කොට ඇත. මේ භාණ්ඩ වලට රෙදි සෝදන යන්ත්‍ර, සීතකර, බිම් මදින යන්ත්‍ර, ශබ්ද පටිගත කරන යන්ත්‍ර, නාන කාමර වලට ගන්නා සුඛෝපභෝගී උපකරන, බුමුතුරුනු, විදුලිය උපකරණ අයත් වෙයි. මේ වෙනස්කම් වලට අමතරව, 1962–63දී පැන වූ සියයට 20 අධිභාරය නිසා මැකී ගිය වරණීය නොවන තීරු බදු පරතරය නැවත ඇති කිරීම සඳහා ආනයන තීරු බදු වල සුළු සුළු වෙනස්කම් කරන ලදී. සුපිරි පැට්‍රල් වල තීරු බද්ද ගැලුමකට සත 10කින් වැඩි කරන ලදී.

### ජාතික ලොතරැයිය

ආරෝග්‍යශාලා ලොතරැයිය වෙනුවට සති දෙකකට වරක් පවත්වන තෑගි 500 කින් යුතු ජාතික ලොතරැයියක් අරඹා ඇත. ජාතික ලොතරැයියේ තෑගි, බදු වලින් නිදහස්ය.

### ජීවන වියදම අඩු කිරීමේ විධිවිධාන

ජීවන වියදම අඩු කිරීමෙහි ලා අය-වැය ලේඛනයේ යෝජිත විධිවිධාන වලින් පහත සඳහන් විධිවිධාන වැදගත් වෙයි.

(අ) පිටි රාත්තලක සිල්ලර මිල සත 5 කින් අඩු කිරීම නිසා, පිටි රාත්තලක මිල සත 23ක් වන අතර, පාන් රාත්තලක මිල සත 25 ක් වෙයි.

(ආ) භූමි තෙල් ගැලුමක මිල සත 4කින් අඩු කොට, භූමි තෙල් ගැලුම සත 94කට ලබා ගැනීමට සැලැස්විය.

(ඇ) කපු පිළි, කපු සාරි, කෘත්‍රිම සේද රෙදි, ක්‍රේප් සහ සැටින් වල ආනයන තීරු බදු අඩු කළේය.

### වර්තන වියදම්

මුළු ආවර්තන වියදම රුපියල් කෝටි 179·04ක් විය. (වැය ශීර්ෂ 1, 2, 4 සහ 6) මේ සංඛ්‍යාවෙන් ආවර්තන වියදම් යටතේ ඇති ප්‍රාග්ධන ස්වරූපීය වියදම් ද නිදන් අරමුදල් දීමනා ප්‍රතිපාදන ද කෙළින් ම ගෙවන ණය ද අඩු කළ විට, වර්තන වියදම සඳහා ලැබෙන ගණන රුපියල් කෝටි 166·07 ක් වෙයි. මෙය 1962-63 කැරුන මුළු වියදම වන රුපියල් කෝටි 152·49 හා සැසඳේ. 1963-64 දී වර්තන වියදම වැඩිවීමට හේතු වූයේ ආහාර ආධාරය, රාජ්‍ය ණය සඳහා පොළී සහ විශ්‍රාම වැටුප් වැඩිවීමය.

### ප්‍රාග්ධන වියදම්

මුල් ඇස්තමේන්තුවට අනුව ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 51·64ක් විය. (වැය ශීර්ෂ 3–5 සහ 7) ආවර්තන වියදම් යටතේ ඇති ප්‍රාග්ධන ශීර්ෂ සමග අය–වැය ලේඛනයට අමතරව සංචිත යෙන් කැරෙන ප්‍රාග්ධන වියදම් බදු සහ අත් කර ගනු ලබන මූල්‍ය වත්කම් ද එකතු කළ විට, 1963–64 මුදල් වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 63·94 ක් වෙයි. මේ සංඛ්‍යාව 1962–63 තත්‍ය වියදම් වලට වඩා රුපියල් කෝටි 14.35 කින් වැඩිය. 1962–63 මුල් ඇස්තමේන්තු

---

1. විදේශීය විනිමය බද්ද 1964 ජනවාරි 11 වැනි දින සිට බලපැවැත්විණි. ඒ ඒ ගෙවුම් වර්ග අනුව අදාලවන බදු අනුපාතිකයන් සියයට 10 ක් හා සියයට 20 ක් විය.

වලට වඩා රුපියල් කෝටි 6.91 කින් වැඩිය. මෙසේ රුපියල් කෝටි 14.35 කින් වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ, නිෂ්පාදන, පතල්, වෙළෙඳාම, යටතේ කැරෙන වියදම් සහ රාජ්‍ය නියෝජ්‍යත්ව වලට දෙන ලද ණය වැඩිවීමය.

**අයවැය හිඟය පියවීම**

අවසාන වරට පාර්ලිමේන්තුවෙන් සම්මත වූ රජයේ ගිණුම් වලින් පිළිබිඹු වන පරිදි රුපියල් කෝටි 47·45ක අය-වැය හිඟයක් දක්වේ. මේ හිඟය පියවීම සඳහා රුපියල් කෝටි 22·0 ක් දේශීය ආයතන හා අනෙකුත් ආයෝජකයන්ගෙන් ණයට ගැනීමටත්, රුපියල් කෝටි 17·5ක් විදේශාධාර වලින් ලබා ගැනීමටත්, රුපියල් කෝටි 2·5ක් පරිපාලන ණය ගැනීම් වලින් ලබා ගැනීමටත් බලාපොරොත්තු විය. මෙහි මුළු එකතුව, රුපියල් කෝටි 42·0 කි. ඉතිරි රුපියල් කෝටි 5·45, කොටසක් රජයේ සුරැකුම්පත් වෙළෙඳ බැංකුවලට විකිණීමෙන් ද, කොටසක් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ද ලබා ගැනීමට බලාපොරොත්තු විය.

මීලඟ කොටසින්, ලැබෙන විදේශාධාර වෙන වෙනම ගෙන සවිස්තරව විග්‍රහ කොට ඇත.

**විදේශාධාර**

විදේශාධාර වශයෙන් රුපියල් කෝටි 17.5ක් ලැබෙතැයි 1963-64 අය-වැය ලේඛනයෙන් බලාපොරොත්තු විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 2.5 කින් වැඩිය. 1962–63 නියම විදේශීය ආධාර හා සසඳන විට මෙය රුපියල් කෝටි 7.52 කින් වැඩිය. මෙයින් රුපියල් කෝටි 13.03ක් නියමිත යෝජනා ක්‍රම සඳහා වෙන් කැරිණි. මේ මුදලින් රුපියල් කෝටි 10.68ක් ණය මාලාවන් යටතේ ලැබෙන ණය වලින් ද, රුපියල් කෝටි 2.4ක් දීමනා වලින් ද ලැබේ.

රුපියල් කෝටි 3.86ක්, සෝ.ස.ස.සං. යෙන් දීමට පිළින දී තිබෙන රුපියල් කෝටි14.28ක ණය මාලාවෙන් ලැබෙතැයි මේ මුදල් වර්ෂයේදී බලාපොරොත්තු වෙයි. මේ ණයෙන් රුපියල් කෝටි 1.5 ක් යකඩ හා වානේ සමායතනයට ද, රුපියල් කෝටි 2.0ක් ටයර් සහ ටියුබ් සමායතන යටද ණය වශයෙන් දෙනු ලැබේ. ඉතිරි මුදල පළතුරු හා එළවළු තබා ගැනීම සඳහා නුවර තැනීමට යෝජිත සීතකර ගබඩාව සඳහා ද, පිටි මෝලක් ඉදි කිරීම සඳහා ද යෙදවේ. ජාත්‍යන්තර ප්‍රතිසංස්කරන හා සංවර්ධන බැංකුවෙන් ලැබෙන (ප්‍රථමයෙන් ගිවිස ගෙන ඇති ණය වලින්) රුපියල් කෝටි 3.01ක ණය මුදල 1963-64 බදු වර්ෂය තුල ජල විදුලි යෝජනා ක්‍රමයේ 2(අ) සහ 2(ආ) අවස්ථාව සඳහා ද ග්‍රෑන්ඩ්පාස්හි පිහිටුවනු ලබන දෙ වැනි 'තර්මල්සෙට්' යන්ත්‍රය සඳහා ද යෙදවෙයි. ලැබෙන අනෙකුත් ප්‍රධාන විදේශාධාර මෙසේ ය :— (අ) බටහිර ජර්මනියෙන් රුපියල් කෝටි 1.64—මෙයින් රුපියල් කෝටි 1.41 ක් ලංකා සිමෙන්ති සමායතනය සඳහා වැය වෙයි. (ආ) කැනඩාවෙන් රුපියල් කෝටි 2.13—මෙයින් රුපියල් කෝටි 0.96 ක් මස්කෙළි ඔය යෝජනා ක්‍රමය සඳහා වැය වෙයි.

සටහන:—අය වැය ඇස්තමේන්තු සැකසීමෙන් පසු ලෝක වෙළෙඳ පොළේ හාල්, සීනි සහ පිටි මිල වැඩි විය. මෙයට අමතරව නැව් කුලී ද වැඩිවිය. මේ භාණ්ඩ ගොඩබාන මිල මෙසේ වැඩිවීමත් ඊට අතිරේකව නැව් ප්‍රමාද කිරීමේ වන්දිත් නිසා, ආහාර ආධාර වියදම් රු. කෝටි 27.29 සිට රු. කෝටි 43.99 තෙක් රුපියල් කෝටි 16.70කින් වැඩිවිය. (1964 පෙබරවාරි 13 වැනි දින ගරු මුදල් ඇමති තුමා විසින්, පාර්ලිමේන්තුවේදී කැරුන ප්‍රකාශය.)